**ආඛ්‍යානnarrations**

**Volume 09 | Issue 01 | January-June 2024 | Article 03**

**ISSN 2478-0642**

Open Access, Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies, Sabaragamuwa University of Sri Lanka

Submit your academic papers to director@cikcs.sab.ac.lk

Follow this and additional works at: www.sab.ac.lk

e-mail: director@cikcs.sab.ac.lk

---

# පුරවැසි ගැටලු හා අභියෝග: ආන්තිකරණ ප්‍රජාවක් ලෙස මලෙයග දමිළ ප්‍රජාවගේ සමාජ ආර්ථික දේශපාලනික අර්බුදය

**සමදරා දිල්කි තාරුකා බටුවන්තුඩාව,** සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, sd.tharuka97@gmail.com

**සුරංජිත් ගුණසේකර,** සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, suranjith@soci.ruh.ac.lk

**Received:** 09 November 2023 / **Revised:** 02 February 2024 / **Accepted:** 01 March 2024

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාව තුළට වර්ෂ 1823-1824 දී දකුණු ඉන්දියානු දමිළ ප්‍රජාවක් පැමිණි අතර ඔවුන් මෙරට වතු වගාවන් සඳහා ගෙන්වා ගන්නා ලදී. ඉන් පිරිසක් මෙරට ස්ථිර වශයෙන් පදිංචි වූ අතර ඔවුන්ට පුරවැසිභාවය පිළිබඳ ගැටලු විටින් විට මතුවිය. නමුත් 2003 අංක 35 දරණ පුරවැසිභාවය පිළිබඳ පනත සංශෝධනය කරමින් සියලුම ඉන්දීය දමිළ ප්‍රජාවන්ට පුරවැසිභාවය ලැබී අවසන් විය. නමුත් මොවුන්ගේ පුරවැසිභාවය පිළිබඳ වර්තමානයේ ප්‍රහේළිකාවක් බවට පත්වන්නේ ඔවුන්ගේ ජීවන තත්ත්වය හේතුවෙනි. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව බවට පත්වූයේ සුළුතර ප්‍රජාවක් ලෙස මලෙයග දමිළ ප්‍රජාව දීර්ඝ කාලීන සමාජ ආර්ථික හා දේශපාලනික ප්‍රපංචයන්ගෙන් බහිෂ්කරණය වීමට බලපාන ලද පුරවැසිභාවයේ අර්බුදය සොයා බැලීමයි. එහිදී පර්යේෂණ අරමුණ බවට පත් වූයේද මොවුන්ගේ මෙම අර්බුදයට සැඟවුණු හේතු සාධකයන් සොයා බැලීමයි. උප අරමුණු ලෙස රජයේ භූමිකාවන් හා වෙනස් කොට සැලකීම් මෙන්ම ප්‍රජාවගේ භූමිකාවන් හා සංවර්ධනයේ පවතින දුර්වලතා හඳුනා ගැනීමත් වේ. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ සැලැස්මක් යටතේ සිදු කරනු ලැබූ අතර නුවරඑළිය ප්‍රදේශයේ අහඹු ලෙස තෝරාගත් දත්තදායකයින් විසිදෙනෙකුගෙන් ප්‍රාථමික දත්ත ගැඹුරු සමඟ සාකච්ඡා හා නිරීක්ෂණයන් තුළින් රැස් කරගත් අතර

ද්විතියික දත්ත ලෙස *Institution of Social Development* යන ආයතනයෙන් ලබාගත් ලිපි හා වාර්තා ඇතුළත් වේ. මලෙයග දමිළ ජනතාව ජාතියට වඩා ජනවාර්ගිකත්වයට මුල් තැන ලබාදීම හේතුවෙන් ඔවුන් විසින්ම ඔවුන්ව සමාජය තුළ ආන්තීකරණයට ලක් කරගෙන ඇත. එහිදී ඔවුන්ට ශ්‍රී ලාංකික පුරවැසිභාවය තිබුණද ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා හඬක් නැගීමට නොහැකි වන්නේද ඔවුන් තුළ පවතින්න දැනුමේ දුර්වලතාවය හා ඒ හරහා සමාජය තුළ බලයක් නොමැති වීමෙනි. එමෙන්ම ඔවුන්ගේ දැනුම වර්ධනය කර ගැනීම නිවැරදි සමාජානුයෝජනයක් සියලුම පරම්පරාවන්වලට සිදුකිරීම, එමෙන්ම උපසංස්කෘතිය මෙන්ම මහා සංස්කෘතියට අනුගත වීම, සමාජයේ සාමාජිකයන් විසින්ම බලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු නොවීම හේතුවෙන් පුරවැසිභාවය හිමිවුවද ඔවුන්ට මෙවැනි වූ සමාජ ආර්ථික දේශපාලනික ගැටලුවලට දීර්ඝ කාලීනව මුහුණ දීමට සිදුවී ඇත. එමෙන්ම රාජ්‍ය අංශයේ භූමිකාවන් ලෙස ප්‍රතිපත්ති සකස් කිරීමේදී ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවන්ට අවධානය යොමු වූ කිරීමත් මෙම ප්‍රජාවගේ සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා ඔවුන්ට සුදුසු නිසි සවිබල ගැන්වීමේ ක්‍රමවේදයක් සකස් කිරීමත් වැදගත් වේ. අවසාන වශයෙන් නිසි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීමත් ඒ වෙනුවෙන් ජනතාවගේ අවධානයක් නොමැතිවීම මත මෙම දමිළ ප්‍රජාව දීර්ඝ කාලීනව සමාජ, ආර්ථික හා දේශපාලනික සංවර්ධන ගැටලුවලට මුහුණ දේ. එය තවදුරටත් රටේ අනෙකුත් ප්‍රපංචයන්ටද බලපෑමක් එල්ල කළ හැකිය.

**ප්‍රමුඛ පද:** *ආර්ථිකය, දමිළ ප්‍රජාව, දේශපාලනය, පුරවැසිභාවය, රාජ්‍ය, සංස්කෘතිය, සමාජානුයෝජනය*

## හැඳින්වීම

ශ්‍රී ලංකාව බහුවිධ සංස්කෘතීන් හා බහුවිධ ආගම් විශාල ප්‍රමාණයක් පවතින ප්‍රජාතන්ත්‍රවාදී රටක් ලෙස සඳහන් කළ හැකිය. මෙහිදී දමිළ ජනතාව ශ්‍රී ලංකාව තුළ විශාල කාර්යභාරයක් සිදුකරන ප්‍රජාව අතරින් ප්‍රමුඛ ස්ථානය සනිටුහන් කරයි. ශ්‍රී ලංකාව තුළට විදේශ විනිමය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන තේ නිෂ්පාදන කර්මාන්තය තුළ වැඩිම ශ්‍රමිකයන් පිරිසක් මෙම ප්‍රජාවන් වීම එයට හේතු සාධක ලෙස දැක්විය හැකිය. කෙසේදයත් දමිළ ප්‍රජාව මෙලෙස තේ වතු ආශ්‍රයෙන් ඔවුන්ගේ ජීවනාලිය ආරම්භ කිරීමට ප්‍රධාන වන හේතු කාරණා කිහිපයක් ඉතා ඈත අතීතයේදී නිර්මාණය වී ඇති බව පෙන්වා දිය හැකිය. මෙලෙස වතුකරය ආශ්‍රිතව සිටින දමිළ ජන කොට්ඨාසය 19 වන සියවසේ සිට ඉන්දියාවේ දකුණු ප්‍රදේශවලින් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ ප්‍රජාවක් වේ. වතු ප්‍රජාව ලංකාවට සංක්‍රමණය වීමට බලපෑ මූලික හේතු සාධක අතර ලංකාව යටත් විජිත රාජ්‍යයක් වීම වැදගත් වෙයි. යටත් විජිත පාලකයෝ ඔවුන්ගේ අභිමතයට ගැළපෙන පාලන ව්‍යුහයක් ලංකාවේ ප්‍රතිෂ්ඨාපනය කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස එතෙක් ලංකාවේ පැවති සාම්ප්‍රදායික කෘෂි ආර්ථික ක්‍රමය වෙනස් වී වාණිජ භෝග ප්‍රමුඛ කරගත් වතු වගා ක්‍රමයක් ලංකාවේ ස්ථාපිත විය. මේ අනුව 19 වන ශත වර්ෂයේ බ්‍රිතාන්‍ය පාලන

සමයේදී ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රය තුළට 'වත්ත' නමැති සංකල්පය ඇතුළු විය. භෝග වැවීම ඊට පෙරද පැවති නමුත් වතු වගාවන් ඇරඹෙන්නේ 19 වන ශත වර්ෂයේ සිටය. බ්‍රිතාන්‍ය ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් විසින් කෝපි, තේ, රබර් වැනි වාණිජ භෝග විශාල වශයෙන් වගා කිරීමට පටන් ගන්නා ලදී (ද සිල්වා, 2005). මෙහිදී ඔවුන් විසින් ගෙන්වන ලද දමිළ ප්‍රජාවෙන් පිරිසක් නැවත ඉන්දියාවට සංක්‍රමණය වීමත් පිරිසක් ජීවිතක්ෂයට පත්වීමත් සිදුවිය (Institute of Social Development, 2017). ඉන්පසු ඉතිරි සියලුම දමිළ ප්‍රජාව නුවරඑළිය, බදුල්ල, රත්නපුර, මහනුවර කෑගල්ල, කළුතර, මාතලේ, ගාල්ල සහ මොනරාගර වැනි ප්‍රදේශවල පදිංචි විය (ද සිල්වා, 2005).

මෙලෙස ශ්‍රී ලංකාව තුළට සංක්‍රමණය වී දමිළ ජන කොට්ඨාසය ශ්‍රී ලංකාව ඔවුන්ගේ නවාතැන්පළ කරගනිමින් ක්‍රමක්‍රමයෙන් ජනාවාසයන් ගොඩනගා ගනිමින්, යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම සඳහා වැඩ කටයුතු කිරීම මෙන්ම ඔවුන්ගේ ප්‍රධාන වශයෙන් සංක්‍රමණය වූ හේතු වශයෙන් කෝපි නිෂ්පාදනය තුළ නිරත වී ඇත. ඔවුන් කෝපි නිෂ්පාදනය නොසිතූ ලෙස කඩා වැටීමට ලක් වූ හෙයින් එම නිෂ්පාදන නතර කරමින් ඔවුන් තේ වගාවන් සඳහා යොමුවිය. ඉන් ජීවිතය ඇරඹී ඔවුන් වර්තමානය වන විට ද ශ්‍රී ලංකාව තුළ තේ වගාව මෙන්ම තේ කර්මාන්තය තුළ ප්‍රධාන කොට්ඨාසයක් ලෙස කටයුතු කරමින් ජීවත් වෙයි. මෙලෙස ඉන්දියාව තුළින් සංක්‍රමණය වූ සංක්‍රමණිකයන් වටා ගෙතුණු විශේෂ නාමයන් පවතී. එනම් ඔවුන්ව මලෛයග දමිළ ප්‍රජාව ලෙස හඳුන්වයි. දකුණු ඉන්දියාවෙන් පැමිණි මෙම ජන කොට්ඨාසය ආමන්ත්‍රණය කිරීම සඳහා යොදා ගන්නා නම් අතරින් මලෛයග (Malaiyaga Thamilar) යනු තවත් එක් නාමයකි (Institute of Social Development,2017). එමෙන්ම එය ඔවුන්ගේ අනන්‍යතාවය ලෙස ඔවුන් ඉතා අභිමානයකින් යුතුව කථාබහ කරයි. එමෙන්ම දහනව වන සියවස තුළ ඉන්දියාවේ සිට පැමිණි මෙම ජන කොට්ඨාසය 2023 වර්ෂය වන විට එම සංක්‍රමණික ක්‍රියාවලිය අවුරුදු 200 සමරනු ලබයි.

නමුත් අතීතයේ යටත් විජිත පාලන සමය තුළ මෙම ජනතාව 'මලෛයග' යන නාමය හරහා ආන්තිකරණයට ලක් කිරීම මෙන්ම ජන සංගණනයේ දී පවා ඔවුන්ව 'මලබාර් කුලී' යන අපහාසාත්මක යෙදුම් භාවිත කර ඇත (Institute of Social Development, මලෙයග ප්‍රදර්ශනය, 2023). එවකට ශ්‍රී ලංකාව තුළ සිංහල ජනයා මෙන්ම මෙලෙස සංක්‍රමණය වූ දමිළ ජනතාවට අමතරව වෙනත් දමිළ ජන කොට්ඨාසයක් සිට ඇති අතර මෙම දමිළ ප්‍රජාවගෙන් සංක්‍රමණික දමිළ ප්‍රජාව හඳුනාගැනීම සඳහා 'කල්ලතෝනි' (නීතිවිරෝධී බෝට්ටු සංක්‍රමණිකයන්) සහ 'තෝට්ටක්කාට්ටන්' (වතුකරයේ මිනිසා) වැනි වෙනත් නින්දිත යෙදුම් භාවිත කරන ලදී (Institute of Social Development, මලෛයග ප්‍රදර්ශනය, 2023). නමුත් පසු කාලීනව 1948 නිදහස ශ්‍රී ලංකාව තුළ ලබා ගැනීමත් සමගම දේශපාලනික, වාර්ගික අනන්‍යතා ප්‍රති නිර්මාණය වීමත් සමග මෙම දමිළ ප්‍රජාව නිල වශයෙන්

'ඉන්දියානු දෙමළ' සහ 'ඉන්දියානු සම්භවයක් ඇති දමිළ' ලෙස හඳුන්වනු ලැබිණි (Institute of Social Development, මලෙයග ප්‍රදර්ශනය, 2023).

පසුකාලීනව මෙම ජනයා වතුකරය තුළම ඔවුන්ගේ ආර්ථික වපසරිය ගොඩනගා ගනිමින් දරුවන් හදා වඩා ගනිමින් පරම්පරා කිහිපයක් මේ වන විට ජීවත් වී ඇත. එහිදී ඔවුන් විසින් යටිතල පහසුකම්, අධ්‍යාපනය පහසුකම් මෙන්ම ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන්, තත්ත්වයන් ගොඩනගා ගැනීම සිදු කරන ලදී. එබැවින් මලෙයග දමිළ ජනතාවගේ සමාජ ආර්ථික සහ සංස්කෘතික ජීවන රටාව පිළිබඳව අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ.

සමාජ, ආර්ථික සහ සංස්කෘතිය යන්නෙන් අදහස් වන්නේ මිනිසුන්ගේ ජීවන රටාව, මිලදී ගැනීම්වල පවතින හුරුපුරුදු, අධ්‍යාපනය, ආගම, විශ්වාසයන්, වටිනාකම්, ජන විකාසන, සමාජ පන්ති, ලිංගිකත්වය සහ ආකල්ප යන ප්‍රධාන සාධක වේ. මෙම සාධක තුළින් කුමන හෝ ජන කොට්ඨාසයක ජීවන තත්වයන් තුළ යෝග්‍යතාවයන් තීරණය කිරීමට හැකියාව පවතී. ඒ අනුව එක් එක් ජන කොට්ඨාසය තුළ මෙම ලක්ෂණ එකින් එකිනෙකට වෙනස් වේ. මෙහිදී තවත් වැදගත් සාධකයක් බවට පත් වන්නේ සමාජ ආර්ථික තත්ත්වයයි. මෙම කී සමාජ ආර්ථික තත්ත්වයන් ඉහත කී සාධක සමග ඍජු බලපෑමක් එල්ල කරයි. එහිදී ප්‍රධාන වශයෙන් ආදායම, රැකියාවේ වර්ගය සහ ඒ සඳහා ලැබෙන කීර්තිනාමය, පදිංචි ස්ථානය මෙන්ම ඇතැම් විට මේ සඳහා වාර්ගික සම්භවය සහ ආගමික පසුබිම ප්‍රධාන වශයෙන් බලපානු ලබයි. සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳව පරීක්ෂාවේදී බොහෝ විට සම්පත්වලට ප්‍රවේශ වීමේ අසමානතාව මෙන්ම වරම් වරප්‍රසාද බලය සහ පාලන සම්බන්ධ ගැටලු මතු වේ. මෙම අසමානතාවය ගොඩනැගීම සඳහා රජය තුළින් තල්ලු කරනු ලබන ප්‍රධාන පුරුක වන්නේ පුරවැසිභාවය වේ. ඒ අනුව මලෙයග දමිළ ජනතාවගේ මෙම සමාජීය ආර්ථික සහ සංස්කෘතිය යන ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කිරීම වැදගත් වනවා සේම ඔවුන්ට ලැබී ඇති පුරවැසිභාවය හරහා කෙතෙක් දුරට ඔවුන්ගේ ජීවිත තුළට බලපෑමක් එල්ල කරන්නේද සහ සාධාරණයක් ඉටු කරන්නේද යන්න සාකච්ඡා කිරීම වැදගත් වේ.

**සාහිත්‍යය විමර්ශනය**

පුරවැසිභාවය රාජ්‍යයක් තුළ පුරවැසියකු සතු නීත්‍යානුකූල තත්ත්වය (Legal Status) ලෙස පවතින සහ එම රට තුළ තවදුරටත් මෙම පුද්ගලයා උපන් රට විය යුතු නැත යන අදහසින් ලබාදෙන වරප්‍රසාදයකි. තවදුරටත් පැහැදිලි කිරීමේදී සිවිල් දේශපාලන සහ සමාජ අයිතිවාසිකම් ලැබෙන සහ ඒවා තමන්ටද ලැබිය යුතු යැයි කෙනෙකුට කිව හැකි අයිතිය ලබාදෙන නීතිමය තත්ත්වයක්ද, රාජ්‍යයක පුරවැසියෙකු 'නෛතික පුද්ගලයෙකු වේ' යන අදහසද මේ හරහා පෙන්වා දිය හැකිය

(උයන්ගොඩ, 2010). මෙම පුරවැසිභාවය ඉතිහාසය සිට මෑත කාලය තුළ දේශපාලන වෙනස්කම්වලට අනුවර්තනය වෙමින් පැවත ගෙන එන සාධකයක් බවට පත්ව ඇත. ඒ අනුව පුරවැසියාගේ අයිතිය තීරණය කිරීම නීත්‍යානුකූල කර්තව්‍යයක් මෙන්ම ඒ සඳහා දේශපාලන මැදිහත්වීම හා තීරණ ගැනීම වක්‍රාකාරව බලපානු ලබයි. සංක්‍රමණය හේතුවෙන් පුරවැසිභාවය ලබා ගැනීමට හැකියාව ආකාර කිහිපයක් ඔස්සේ වර්ග වීම දක්නට ලැබේ.

1. පවුලේ පුරවැසිභාවය (Family Citizenship) - එනම් මෙය ලේ අයිතිය මත ලබා ගත හැකි පුරවැසිභාවයකි.
2. උපතින් ලැබෙන පුරවැසිභාවය (Citizenship by Birth) - මෙය පුද්ගලයකු උපන් රට තුළ ලැබෙන පුරවැසි අයිතියකි.
3. ස්වභාවීකරණය (Naturalization) - මෙය පුරවැසිභාවය සඳහා පොදු මාර්ගයක් වන අතර එය සාමාන්‍යයෙන් අදාළ වන්නේ දේශපාලන රැකවරණය වැනි නීත්‍යානුකූල ක්‍රම හරහා රට තුළට ඇතුළු වූ අයට හෝ නියම කාල සීමාවක් තුළ රට තුළ නීත්‍යානුකූලව ජීවත් වූ අයට ලැබෙන පුරවැසි අයිතියකි.
4. විවාහයෙන් පසු පුරවැසිභාවය (Citizenship by Marriage) - නීත්‍යානුකූලව පුරවැසිභාවය ඇති පුද්ගලයකු සමඟ විවාහ වීමෙන් හිමිවන පුරවැසිභාවය මෙලෙස හැඳින්විය හැකිය.
5. ආර්ථික පුරවැසිභාවය (Economic Citizenship) - සාම්ප්‍රදායික වශයෙන් පුරවැසිභාවය ලබා ගැනීමට නොහැකි අයට මෙම ක්‍රමය හරහා පුරවැසිභාවය ලබා ගත හැකිය. රටක අර්ථවත් ආර්ථික මූල්‍ය දායකත්වයක් ලබාදෙන ආයෝජකයින්ට මෙය ලබාගත හැකිය (CS Global Partners, 2023).

ශ්‍රී ලංකාව තුළ මෙම පුරවැසිභාවය ලබාදීම ආරම්භ කරන ලද්දේ 1948 නොවැම්බර් 15 දින සිටය. නමුත් ශ්‍රී ලාංකිකයන් ලෙස එවකට සිංහල සහ අනෙක් ජන කොට්ඨාසයන්ට මෙම පුරවැසිභාවය ලැබුණද 1948 දී ලබා දුන් මෙම පුරවැසිභාවය කඳුකරයේ පදිංචි වී සිටි මෙම දමිළ ජන කොට්ඨාසයක අහිමි විය. මේ හේතුවෙන් පුරවැසිභාවය නොමැති වීම මත ඔවුන් විශාල ගැටලු රාශියකට මුහුණ දුන් අතර එය ලබා ගැනීම සඳහා විශාල අරගලයන් ඔවුන්ට කිරීමට සිදු වී ඇත. එමෙන්ම මෙලෙස සටන් වැදීම හේතුවෙන් ඔවුන්ට පුරවැසිභාවය වර්ෂ 1960 සිට 2000 දක්වා ලබාදීමට කටයුතු කර ඇති අතර 2003 අංක 35 දරණ පුරවැසිභාවය පිළිබඳ පනත සංශෝධනය කරමින් සියලු දමිළ ප්‍රජාව පුරවැසිභාවය ලබා දී ඇත. නමුත් පුරවැසිභාවය ලැබුණද ඔවුන් හට පුරවැසියන්ට හිමි විය යුතු සහ ප්‍රජාතන්ත්‍රවාදී රටක ඔවුන්ට ලැබිය යුතු මූලික අයිතිවාසිකම් ලැබෙනවාද යන්න ප්‍රශ්නයක් මතු

වන්නේ ඔවුන්ගේ ජීවන රටාවේ තවමත් පවතින ඌන සංවර්ධනය හේතුවෙනි (Institute of Social Development, මලෙයග ප්‍රදර්ශනය, 2023).

මුල් කාලය තුළදී මෙලෙස දකුණු ඉන්දියාවේ පැමිණි දමිළ ප්‍රජාව සඳහා වතුවලට යාමට අවශ්‍ය ප්‍රවාහනයන්, වෛද්‍ය පහසුකම් නොමිලේ ලබාදිය. එයට හේතුව දකුණු ඉන්දියාවෙන් මෙරටට කම්කරුවන් ගෙන්වා ගැනීමේ අරමුණ හේතුවෙනි. නමුත් පසු කාලීනව මෙම ප්‍රජාවට පහසුකම් ලබාදීම සිදු නොකර ඔවුන්ගේ ශ්‍රමය පමණක් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර වැවිලිකරුවන් විසින් ඔවුන්ව පහත් කොට සැලකීමට ලක් කරන ලදී. 1847 ආණ්ඩුකාර ටෙන්ටන් සඳහන් කරන පරිදි කුලීකරුවන් හට වැවිලිකරුවන් විසින් සලකනු ලැබූ ආකාරය මානුෂික අයිතිවාසිකම්වලට අගෞරවයක් ගෙනදී ඇති අතර එය මිනිසුන්ගේ අයිතිවාසිකම් පාගා දැමීමක් විය (ඩ්‍රිසන්, 1963). අයිතිවාසිකම්, වරප්‍රසාද සහ ගෞරවය නොලැබුණු මෙම දමිළ ජනයාගේ සම්පූර්ණ ජීවිතයම වතුවලට පමණක් සීමා විය. කුලීකරුවන් වතුවල සේවය සඳහාම සිය ජීවිතය කැප කළ අතර වතුකම්කරුවන්ගේ ආර්ථිකය වැසුණු ආර්ථිකයක් ලෙසින් ක්‍රියාත්මක විය (හෝලුන්, 1994).

එමෙන්ම මෙම දමිළ ප්‍රජාව සමාජයේ පහළ මට්ටමක ජීවත් වූ අතර මුල් කාලයේ කංකානම්වරුන්ගේ උපක්‍රමශීලී පාලනය නිසා මොවුන්ට සමාජීය වශයෙන් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවිය. එනම් කංකානම්වරුන් මෙම දමිළ ප්‍රජාවට ණය ලබාදී ඔවුන්ව ණයකරුවන් බවට පත් පත් කළහ (ජයවර්ධන, 1997). 'ඉන්දීය ආගමික කම්කරු පාලකයාගේ වාර්තාවක් අනුව ලංකාවේ ඉන්දියානුකම්කරුවන් උපන්නෙත් ණය ගැතිවය ජීවත්වන්නෙත් ණය ගැතිවය මැරෙන්නෙත් ණය ගැතිවය කංකානම් බොහෝ විට වත්තේ එකම ණය හිමියා විය' (ජයවර්ධන, 1997). කෝපි වගාවන්වලින් පසු තේ වගාවන් සඳහා තම ජීවන වෘත්තිය වෙනස් වූ පසු මෙම ප්‍රජාවගේ ජීවන රටාවේද යම් යම් වෙනස්කම් ඇති විය. එහිදී ඔවුන් බොහෝ විට නිදහසේ තමන්ට අභිමත පරිදි වත්තේ රැකියා සඳහා සංක්‍රමණය වීමට හැකි තත්ත්වයක් උදාවීම හරහා ඉන්දියානු වතු කම්කරුවන්ගේ සමාජයේ සම්බන්ධතාද විවිධ ස්වරූපයන් ගත්හ (සිල්වා, 2005). මෙම ප්‍රජාවගේ වැඩ කිරීමේ තත්ත්වයන් වත්තෙන් වත්තට, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වී ඇති අතර එයට හේතුව බවට පත්ව ඇත්තේ වැඩ කිරීමේ පැය ගණන්වල නීතියෙන් සීමා රෙගුලාසි කිසිවක් නොමැති වීම හේතුවෙනි (ජයවර්ධන, 2004).

දමිළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය දෙස බැලීමේදී වැදගත් ලක්ෂණයක් බවට පත් වන්නේ ඔවුන් ස්වකීය ජාතිය සමඟ එකට විසීමට අදටත් ප්‍රිය කරන බවයි. එනම් මෙයට ඔවුන් මුල් කාලය තුළදී පදිංචි කරනු ලැබූ ආකාරයේ බලපෑමක් වන්නට පුළුවනි. මොවුන්ව පදිංචි කරනු ලැබුවේ පේළි නිවාසයක් තුළය. මේ තුළ ඔවුන්ට පෞද්ගලිකත්වයක් නොතිබුණද ඔවුන්ට මෙලෙස ජීවත්වීම හරහා ණය ගෙවීම සහ

එදිනෙදා ආහාරවේල් සොයා ගැනීම් සඳහා පමණක් අවධානය යොමු කිරීම හේතුවෙන් වතු හිමියන් විසින් ඔවුන්ට ලබා දෙන මෙම ලැයිම් නිවාස ඔවුන්ට මහ මෙරක් සේ සලකා දීර්ඝ කාලීනව අනාගතයක් ගැන නොසිතා ජීවත් වීමට හුරු විය (සිල්වා, 2005).

වතු කම්කරුවන් ලෙස ලයින් කාමර තුළ ජීවත්වීමට හුරු වූ මෙම ප්‍රජාව රටේ සමාජ දර්ශකය තුළ අඩු අගයක් නියෝජනය කරයි. එනම් ඔවුන් මන්ද පෝෂණය, මාතෘ ළමා මරණ අනුපාතය, සාක්ෂරතාවය, මත්පැන් භාවිතය, අධ්‍යාපනය යන අංශයන් ඉතා දුර්වල මට්ටමක විය (මනතුංග, 2016). විශාල ශ්‍රමයක් යොදා වතුවල රැකියාවල නිරත වූ මොවුන් බෙලහීන වීම, කොලරාව වැනි පීඩාවන්ට ගොදුරු වීම, විවිධ බෝවන රෝග ඇතිවීමත් ඒ හේතුවෙන් රැකියාවන් කිරීමට නොහැකි වීමත් ඔවුන්ට වෙනත් ආදායම් මාර්ගයක් නොමැති වීම හරහා වතුකරය අනෙකුත් කම්කරුවන්ද මෙවැනි පිරිස් හේතුවෙන් ප්‍රධාන ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවිය (ජයවර්ධන, 1989). එමෙන්ම මෙම වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය බිඳ වැටී ඇති අතර දරුවන්ගේ මන්දපෝෂණය වැඩිවීම සිදු වී ඇත. එමෙන්ම වෙනත් සෞඛ්‍ය ප්‍රශ්න රැසකට මුහුණ දීමට සිදු වී ඇති අතරම මෙම වතු ප්‍රදේශයේ සිටින ජනතාව විවිධ උවදුරු එනම් නාය යෑම වලටද මුහුණ දීමට සිදුවන අතර ඔවුන් තේ දල්ලෙන් එහා ලෝකයක් නොදනී (විජේකෝන්, 2016).

ශ්‍රී ලංකාවේ පාසල් යන වයසේ ළමයින් පාසල්වලින් බැහැරවීම හා ඒ සඳහා බලපෑ කරුණු පිළිබඳව හඳුනාගැනීම වැදගත් වේ. එහිදී වතු, ග්‍රාමීය හා නාගරික යන ක්ෂේත්‍ර තුන ඔස්සේ ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා අහිමිවීම පිළිබඳව හඳුනාගෙන ඇත. මෙහිදී ළමයින් පාසලෙන් බැහැරවීමට බලපෑ කරුණු සංඛ්‍යාත්මක අනුපිළිවෙලකට දක්වා තිබේ. ආර්ථික දුබලතා, ළමයින්ට පාසල අභියෝගාත්මක ස්ථානයක් වීම, ළමයින් පාසල් යැවීම පිළිබඳව දෙමව්පියන්ගේ අඩු අවධානය, ප්‍රවාහන ගැටලු, මව නිවසේ නොමැතිවීම ආදී කාරණා ඒ අතර වේ. වතුකරයේ ළමයින් ශ්‍රමිකත්වයට පත්වීම ඔවුන්ගේ අධ්‍යාපනය ඉක්මනින් නවතා දැමීමට හේතු සාධක වී ඇති බව යුනිසෙෆ් සංවිධානය විසින් දෙදහස් දහතුනේ දී කළ *out of school children in Sri Lanka* නම් අධ්‍යයනය තුළින් පැහැදිලි කරනු ලබයි (www.unisef.org, 2014). වතු කම්කරුවන්ගේ දැනුම තුළ පවතින විහීනතාවයට හේතුවක් ලෙස ඔවුන්ගේ ඉගෙනුම් දරිද්‍රතාවය පෙන්වාදිය හැකිය. ඉගෙනුම් දරිද්‍රතාවයෙන් මිදීමට අධ්‍යාපනික වශයෙන් මොනයම් හෝ අභිප්‍රේරණ වැඩසටහනක් ක්‍රියාත්මක කළද එය චාරිත්‍රයක් මෙන් දිගින් දිගටම සිදුවෙමින් පවතී (ගොයාරි, බොසුමාටාරි, 2013). එමෙන්ම මෙම වතු ප්‍රජාවගේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට පවතින අඩු ලුහුඩුකම් පාසල් පද්ධතිය නිසි ලෙස කළමනාකරණයක් නොමැති වීම අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම නිදහස් අධ්‍යාපනයේ සීමා හා අධ්‍යාපනය පිළිබඳව පවතින අවම ගුරුවරු සහ මූලාශ්‍රය හේතුවෙන්

මොවුන්ගේ අධ්‍යාපනය අභියෝගයට ලක්වී තිබේ (ජසෙල්, අල්ශෙබසබ්, සරවනකාමර්, 2017). මෙම වතුකරයේ ප්‍රජාව අධ්‍යාපනය සඳහා යොමුවීමට පවතින ප්‍රධාන බාධකයක් ලෙස ආර්ථික පහසුකම් නොමැතිවීම පෙන්වාදිය හැකිය (රත්නායක, 2016).

දකුණු ඉන්දියාවෙන් ගෙන්වන ලද මෙම මලෙයග දමිළ ජනතාව කම්කරුවන් ලෙස ගෙන්වා ගැනීම සිදුකරනු ලැබුවද ඔවුන්ට වැටුප් ගෙවීමේදී අසාධාරණ ලෙස තුණ්ඩු ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇති බව 'ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම' නම් කෘතිය තුළින් පෙන්වා දෙනු ලබයි (ජයවර්ධන, 1989). ශ්‍රී ලංකාව තුළ අතීතයේ වැඩවසම් ක්‍රමය ක්‍රියාත්මක වී ඇති බැවින් එම ක්‍රමය බිඳ වැටී වතු ආර්ථිකය නැගීමක් සිදුවීය. එහිදී වතු ආර්ථිකයේ ප්‍රධාන නිෂ්පාදන සාධකය බවට ශ්‍රමය පත්විය. මෙහිදී වැවිලි කර්මාන්තය ශ්‍රම සූක්ෂ්ම ව්‍යාපාරයක් වීම නිසා වතු වගාව පැතිරී යන විට ශ්‍රමය සහ ඉල්ලුම සීඝ්‍රයෙන් පුළුල් වූ බවත් ඒවායින් සිංහලයන් ප්‍රයෝජන නොගත් අතර, මෙලෙස දමිළ ප්‍රජාවන් සඳහා මෙම වතුකර ක්ෂේත්‍රය තවදුරටත් පුළුල් වූ බව 'ශ්‍රී ලංකාවේ ආර්ථිකය නූතන යුගය' යන ග්‍රන්ථය තුළින් පෙන්වා දෙයි (ඊරියගම, 2006).

ශ්‍රී ලංකාවට පැමිණි පසු මෙම දමිළ ප්‍රජාව ස්ථිර වශයෙන් සේවයට බඳවා ගැනීම මත ඔවුන්ට ඉන්දියාවේ තිබූ පුරවැසිභාවය අහිමිවීමද, එමෙන්ම ශ්‍රී ලංකාව තුළ පුරවැසිභාවය නොලැබීමද සිදුවිය. මේ තත්ත්වය තුළදී මෙම ජනතාව රටක් නොමැති ජාතියක් බවට පත් වූ අතර, කම්කරු අයිතීන් හා වරප්‍රසාද ලබා ගැනීම සඳහා යොමුවීමට අවශ්‍ය දැනුම සහ මානසික පසුබිම ඇතුළුවීමට හැකි සෑම මගක්ම රාජ්‍ය අංශය මෙන්ම වැවිලිකරුවන් හා කංකානිවරුන් විසින් අහුරනු ලැබීය (ජයවර්ධන, 2004). නමුත් වතු කම්කරුවන් මුහුණ දුන් ගැටලු හේතුවෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පසු කාලීනව ඔවුන් විවිධ වෘත්තීය සමිති ක්‍රියා මාර්ගවලට යොමු වීමට පටන් ගත්හ. එහිදී 1913 සිට 1922 දක්වා කාලය තුළ පැවති ආඥා පනතට විරුද්ධව සටන් වැදි අතර 1930 දී වෘත්තීය සමිති පිහිටුවා ගැනීම සිදුවිය (කරුණානන්දා, 1990).

වතු කම්කරුවන් සම්බන්ධයෙන් වැදගත් දේශපාලනික කතිකාවතක් ගොඩනැගීම සිදුවූයේ 1931 දී ඔවුන්ට ඡන්ද බලය ලැබීම හේතුවෙනි. අතීතයේ දී ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා ආදායම, දේපළ හා උගත්කම යනාදී සුදුසුකම් සැපරීමට සිදු විය (ජයවර්ධන,2004). නමුත් කම්කරුවන්ට ඡන්ද බලය හිමි වුවත් පුරවැසිභාවයේ ගැටලු නිරන්තරයෙන් ඔවුන්ට මතුවිය. නමුත් පසුව කම්කරු ව්‍යාපාරය හරහා පුරවැසිභාවයද ලබා ගැනීමට උත්සාහ කර අතර ඒ තුළින් ඇති වූ දේශපාලනික පිබිදීම මත මෙම වතු ප්‍රජාව සඳහා දේශපාලනමය වශයෙන් අවධානයක් යොමුවිය. එහිදී මෙම වතු ප්‍රජාවගේ ශුභසාධන සඳහා විවිධ පනත් ගිවිසුම් ඇති විය.

1. වතු නිවාස පනත
2. රෝගී පනත
3. වෛද්‍ය අවශ්‍යතා පනත
4. වතුකම්කරු පනත
5. මාතෘත්වය සම්බන්ධ පහසුකම්
6. කම්කරුවන්ගේ අලාභ ගෙවීම් පනත

(ද සිල්වා, 2005).

මෙම දමිළ ප්‍රචාවගේ ජීවන තත්ත්වයන් එනම් සමාජීය, ආර්ථික, දේශපාලනික පසුබිම හා ස්වභාවයන් ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණි පසු දශක කිහිපයක ජීවන තත්ත්වයන් ප්‍රසාරණය වී ඇති ආකාරය පූර්ව අධ්‍යනයන් තුළින් හඳුනාගත හැකියි.

**පර්යේෂණ අරමුණු**

මෙම අධ්‍යයනයේ කේන්ද්‍රීය අරමුණ බවට පත්වන්නේ සුළුතර ප්‍රජාවක් ලෙස මලෛයග දමිළ ප්‍රජාව දීර්ඝ කාලීනව සමාජ ආර්ථික හා දේශපාලනික වශයෙන් බහිෂ්කරණයට ලක්වීමට සැඟවුණු හේතු සාධක (Hidden Causes) සොයා බැලීමය. ඒ මත පදනම් වුණු පහත සඳහන් උප අරමුණු කෙරෙහි අධයනයේ අවදානය යොමු වුණි.

**උප අරමුණු**

- මෙම මලෛයග දමිළ ප්‍රජාව වෙනුවෙන් රාජ්‍ය අංශයේ පවතින මැදිහත්වීමේ ස්වභාවය හා භූමිකාව හඳුනා ගැනීම
- •ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවක් වශයෙන් සමාජ ආර්ථික දේශපාලනික ක්‍රියාවන් සඳහා ඔවුන්ට පැවරී ඇති භූමිකාවන් හඳුනා ගැනීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය හරහා ශ්‍රී ලංකාවේ නුවරඑළිය ප්‍රදේශයේ ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවක් වන මලෛයග දමිළ ජනතාවගේ දෛනික ජීවිතයේ ස්වභාවය අධ්‍යයනය කිරීම සහ මානව යථාර්ථවාදය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම හේතුවෙන් මෙම අධ්‍යයනය සත්භාවවේදය පසුබිම යටතේ

ගුණාත්මක පර්යේෂණයක් ලෙස සිදුකරන ලදී. මෙය පුළුල් ලෙස අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා නිර්මාණවේදය සහ අර්ථකථනවාදය භාවිත කිරීම වැදගත් වේ. මෙම අධ්‍යයනයේ අධ්‍යයන සැලැස්ම ලෙස ප්‍රපංචවේදී ආනුභවික ව්‍යුහය යොදා ගන්නා ලදී. එමෙන්ම මෙහි දත්ත තෙවන පාර්ශවීය දෘෂ්ටි කෝණයක් හරහා අහඹු ලෙස තෝරාගත් පුද්ගලයින් විසි දෙනෙකුගේ නියැදියක් තෝරාගෙන දත්ත එක් රැස් කරන ලදී. ඒ අනුව අහඹු ලෙස තෝරා ගත් කාන්තාවන් දස දෙනෙකුද පුරුෂයින් දස දෙනෙකුද ඒ අතර විය. මෙම පර්යේෂණයේ දත්ත රැස්කිරීම සඳහා යොදා ගත් ක්‍රමවේදයන් ලෙස ප්‍රාථමික හා ද්විතික දත්ත හඳුන්වා දිය හැකිය. එහිදී ප්‍රාථමික දත්ත ලෙස ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ක්‍රමය යොදාගත් අතර ද්විතික දත්ත ලෙස ISD ආයතනයේ වාර්තා සහ ලිපිගොනු ආශ්‍රයෙන් ලබා ගන්නා ලදී. මෙලෙස ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා තේමා විශ්ලේෂණය යොදා ගන්නා අතර ඒ තුළින් පර්යේෂණයේ අරමුණු පැහැදිලිව පෙළගැස්විය හැකිය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ මලෙයගයා යන දමිළ ප්‍රජාවට ශ්‍රී ලංකාව තුළ මුල් කාල සීමාවේදී පුරවැසිභාවය අහිමි විය. එහිදී ශ්‍රී ලංකාව තුළදී මෙන්ම ඔවුන් ජීවත් වන සමාජය තුළ සාමාජිකයන් නොවන සරණාගතයන් බවට පත්විය. කෙසේදයත් මොවුන්ට මූලික අයිතිවාසිකම් අහිමි වී ඔවුන් විශාල අසාධාරණකම් රැසකට මුහුණ දීමට සිදු විය. එමෙන්ම යටිතල පහසුකම්වල සිට ඔවුන්ගේ රැකියාවන් කරන පසුබිම් දක්වා ඇති මූලික අයිතිවාසිකම් සියල්ල අහිමි විය. නමුත් ඔවුන්ට කෙසේ හෝ පුරවැසිභාවය හිමි වුවද වර්තමානය වන විටත් ඔවුන් ජීවත් වන්නේ ඔවුන් මීට පෙර ලංකාවට සංක්‍රමණය වූ කාල සීමාව තුළ තිබූ දුෂ්කර ජීවිතයමය. එය පූර්ව අධ්‍යයනයන් සහ වර්තමාන දත්ත සංසන්දනය කිරීම හරහා පැහැදිලි වේ. මේ සඳහා බලපාන හේතු සාධක සාකච්ඡා කිරීමේදී දත්ත අනුව ප්‍රධාන ආකාර ද්විත්වයක් හඳුනාගත හැකි විය. එනම්,

1. රාජ්‍ය ආයතන භූමිකාව සහ වෙනස් කොට සැලකීම
2. මලෙයගයා දමිළ ජනතාවගේ භූමිකාව හා සංවර්ධන ගැටලු

යන ප්‍රධාන තේමා ද්විත්ව ඔස්සේ ඉදිරියට මෙම අධ්‍යයනය විශ්ලේෂණය කිරීමට බලාපොරොත්තු වේ.

**රාජ්‍ය ආයතන භූමිකාව සහ වෙනස් කොට සැලකීම**

ශ්‍රී ලංකාව තුළ සිටින ඉන්දියානු සම්භවයක් ඇති මෙම දමිළ ජනතාවට 2003 වන විට පුරවැසිභාවය ලැබී අවසන් වුවද මූලික අයිතිවාසිකම්, රටේ අනෙකුත් සාමාජිකයන්ට හිමිවන පහසුකම් සියල්ලම

ඔවුන්ට ලැබීම සිදු නොවේ. මෙම මලෙයග ජනතාව බොහෝ විට ජීවත් වන්නේ නුවරඑළිය ප්‍රදේශයේ ය. එහි දී ඔවුන්ව වතුකරය තුළ සිටීමට සිදුවන්නේ ඔවුන්ගේ ආර්ථිකය හා ජීවන රටාව ගොඩනැගී තිබෙන්නේ තේවතු ආශ්‍රයෙන් බැවිනි. ඒ අනුව ඔවුන් මේ වන විටත් ඉඩම් හෝ නිවාස නොමැති වීම දක්නට ලැබේ. ඔවුන් තවමත් ජීවත් වන්නේ අඩි (10×12) ප්‍රමාණයේ ලයිම් කාමරවල වේ. එය පවුලකට ජීවත් වීමට සුදුසු ඉඩ ප්‍රමාණයක් ද යන්න තවමත් ප්‍රශ්නාර්ථයක් ඔවුන්ගේ ජීවිතය තුළ මතු වී තිබේ. නමුත් නුවරඑළිය තුළ ජීවත් වන අනෙක් සියලුම ජන කොට්ඨාස තමන්ට අයිති නිවාසයක් තිබීම එලෙස ප්‍රශ්නාර්ථයක් නැගීමට ප්‍රධාන හේතු සාධකයක් බවට පත්වෙයි.

මෙලෙස ලයිම් කාමර තුළ ජීවත්වන නුවරඑළිය දමිළ ජනතාවට ඔවුන්ටම අයිති පෞද්ගලික තැපැල් ලිපිනයක් නොමැති වීම පුරවැසිභාවය ලැබුණ ද ඔවුන්ගේ අයිතීන් උල්ලංඝනය වන ප්‍රධාන සාධකයක් ලෙස හඳුන්වා දිය හැකිය. රට තුළ නිවාසයක් නොමැති පුද්ගලයෙකු එම රටේ පුරවැසියෙකු නොව සරණාගතයකු බවට පත්වේ. මේ හේතුවෙන් දමිළ ජනයා ලයිම් කාමර තුළ අතීතයේ සිට ජීවත්වීම හේතුවෙන් ඔවුන්ට පෞද්ගලික ලිපිනයක් ලබා දීමට රජය කටයුතු නොකිරීමත් එම ලයිම් කාමර තුලින් ඉවත්ව වෙනත් ස්ථානයක පදිංචියට ගොස් නිවසක් සහ ලිපිනයක් ලබා ගැනීමට එම ජනතාව කටයුතු නොකිරීමත් මෙයට හේතු සාධක වේ. එමෙන්ම රජය විසින් නව ගම්මාන සෑදීමට උත්සාහ කරන අතර එවැනි වරප්‍රසාද ලබා ගැනීමට දමිළ ජනයාට නොහැකිවේ. එයට හේතුව ඔවුන්ට පෞද්ගලික ලිපිනයක් නොමැති වීම හරහා ඒ සඳහා ඔවුන් සුදුසුකම් නොලැබීම හේතුවෙනි. එමෙන්ම රජය විසින් ලබා දෙන විවිධ ණය මෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගැනීමට අපොහොසත් වේ.

> " අපිට ලිපිනයක් නෑ. නව ගම්මාන හදනවා. ඒක නිසා වතු අයින් වෙනවා අපිට ඒවට පහසුකම් නෑ. අපිට සුදුසුකම් නෑ" (පුරුෂ, අවු: 52)

පුරවැසියකුට තිබිය යුතු නිවාස පහසුකම්වල මූලික අයිතිවාසිකම ඔවුන්ට අහිමි වීම හරහා ඔවුන් ඒ හා බැඳුණු සියලුම පහසුකම් ලබා ගැනීමට හැකි ප්‍රවේශයන් අවහිර වන බව පැහැදිලි වේ. එමෙන්ම මෙම ප්‍රජාව තුළ තවමත් උප්පැන්නය ලියාපදිංචි නොමැති පිරිස් සිටී.එහිදී ඔවුන්ට ලැබෙන වරප්‍රසාද මෙන්ම ඇතැම් රාජ්‍ය ආයතනයන්හි අවශ්‍ය කටයුතු කරගැනීමට නොහැකියාව පවතී. එමෙන්ම ඔවුන්ට ඡන්දය ලබාදීම සඳහා ද ගැටලු සහගත තත්ත්වයන් පවතී. මේ හරහා පැහැදිලි වනුයේ ලිපිනය නොමැතිවීම මත, ඡන්ද අයිතිය ලබාගැනීමට නොහැකි වීම හා ඒ හරහා ඔවුන්ට රජයේ ලබා දෙන පහසුකම් එනම් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගැනීමට නොහැකි වීම, දරුවන්ට රජයේ පාසල්වලට යැවීම ආදී ක්‍රියාවන්හි මග අවහිර වීම සිදුවේ. ඒ හේතුවෙන් දේශපාලන පක්ෂ ඔවුන් කෙරෙහි දක්වන අවධානය සීමිත බවයි. නමුත් බොහෝ පුද්ගලයින් සඳහන් කරනු ලැබුවේ දේශපාලන පක්ෂ ඡන්දයන් ආසන්න

කාලය තුළ ඔවුන්ට සියලුම පහසුකම් ලබාදීමට පොරොන්දු වීම ද, සියලුම දේශපාලන පක්ෂයන් නියෝජනය කරමින් දේශපාලනඥයින්ද එම කාලසීමාව තුළ පැමිණෙන බවත් ඔවුන් ඡායාරූප ගෙන ගොස් ඒවා ඡන්දය ලබා ගැනීම සඳහා යොදා ගනිමින් කටයුතු කරන බවත් ඉන් එහාට ඔවුන් වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් ය. එවිට පෙනී යන්නේ වතුකරයේ ජනතාවගේ දරිද්‍රතාවය මෑත කාලයේ ප්‍රයෝජනයට ගනිමින් ප්‍රභූ පැළැන්තියේ ජනතාව ඒවායින් වාසි ප්‍රයෝජන ලබා ගන්නා බවයි. ඒ හරහා දිගින් දිගටම වතු ජනතාව රැවටීමට ලක් වෙමින් පවතී. ඒ හරහා රටක වගකිවයුතු පාර්ශවයන් ද සිදු කරනුයේ ඔවුන්ට ලැබිය යුතු අයිතිවාසිකම් පෙන්වමින් සිටිනවා මිස ඒ සඳහා ක්‍රියා නොකරන බවයි.

> " ඡන්දෙ කාලෙට ඇමතිලා එනවා යනවා. කවදාවත් අපිට ප්‍රයෝජනයක් වෙලා නෑ. එයාලා අපි එක්ක ෆොටෝ ගහලා යනවා ඒව දානවා විතරයි. අපිට දැන් ඒවා හොඳට තේරිලා තියෙන්නේ. එයාලගේ ප්‍රයෝජනයට අපිව භාවිත කරනවා විතරයි. අපිට ඉන් එහාට දුක් විඳින්න විතරයි වෙලා තියෙන්නෙ" (කාන්තාව, අවු: 49)

සෑම රටකම සංවර්ධනය ඇති කිරීම සඳහා විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති ගොඩනැඟීම සිදු කරයි. එය ප්‍රධාන වශයෙන් සමාජයීය, ආර්ථික, දේශපාලනික මෙන්ම සංස්කෘතික පැතිකඩ පිළිබඳව අවධානය යොමු කරමින් සිදු කිරීමයි. එමෙන්ම රටක සිටින සියලුම ජන කොට්ඨාසවලට සාධාරණයක් ඉටු වනසේ රජයේ ප්‍රතිපත්ති සකස් කිරීමත් ඒවා ක්‍රියාත්මක කිරීම ප්‍රජාතන්ත්‍රවාදී රටක ප්‍රධාන ලක්ෂණයක් බවට පත්වේ. ශ්‍රී ලංකාවද බහුවිධ ජාතීන් සිටින රාජ්‍යයක් වන නිසාවෙන් සියලුම රාජ්‍යය ප්‍රතිපත්ති බහු සමාජ, සංස්කෘතික අගයන් සහ ධර්මතාවලට අනුකූලව සහ සියලුම ජනවාර්ගයට සමානතාවය හිමිවන පරිදි ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

නමුත් ඇතැම් විට ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තීන් සකස් කිරීමේ දී නාගරික ප්‍රජාවට මූලිකත්වයක් ලබා දෙන අතර ඉන්පසු පිළිවෙලින් ග්‍රාමීය සහ වතු ප්‍රජාව කෙරෙහි අවධානය යොමුවේ. නමුත් බොහෝ විට නාගරික වශයෙන් ප්‍රතිපත්ති සකස්කර අවසන් කිරීම වර්තමාන රාජ්‍ය අංශය තුළ දක්නට ලැබෙන දුර්වලතාවයකි. මෙම මලෛයග ප්‍රජාව රජයේ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී අවධානය යොමු නොකරන බව අවධානයට යොමුවිය. එයට ප්‍රධාන කාරණා කිහිපයක් බලපානු ලබයි. ඇතැම් රාජ්‍ය ප්‍රතිපත්ති විශේෂයෙන්ම ආර්ථික ප්‍රතිපත්ති, සමාජ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී ඔවුන් කෙරෙහි පවතින අවධානය අවම වේ. ආර්ථිකය පිළිබඳව විමසීමේ දී ආර්ථිකය නගාසිටුවීම සඳහා 2006 වර්ෂයේ දසවසරක වැඩපිළිවෙළක් ඉදිරිපත් වී ඇති බවත් එය තවමත් වතුකරයේ ජනතාව සඳහා ක්‍රියාත්මක නොවීමත් සිදුවන බව සඳහන් කරන ලදී. එමෙන්ම 1992 දී රජයේ වතු පෞද්ගලිකකරණය කරන විට වතුකම්කරුවන්ගේ සමාජ සුබසාධනය පිළිබඳව එම සමාගම් භාර නොගන්නා බව එවකට පවසා ඇති

අතර ඉන් ජනතාවගේ සැනසීම වෙනුවෙන් ආණ්ඩුව එම ජනතාවගේ සුභ සාධනය ඉටුකිරීමට භාර ගන්නා බව සඳහන් කර ඇති නමුත් වර්තමානය විටද ඒවා කිසිවක් නොලබා ජනතාව අපහසුතාවයට පත්ව ජීවත් වන බවත් වතු පෞද්ගලිකකරණය වීම හරහා මෙලෙස ජනතාවගේ නිදහසට ද බොහෝ බාධා ඇතිවී ඇති බවත් ඒ හරහා වර්තමානය වන විටදීත් යටිතල පහසුකම් ලබා ගැනීම ඇතැම් විට දුෂ්කර වී ඇති බව තොරතුරුවලින් අනාවරණය විය.

> " 2006 වසර අවුරුදු දහයක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරා එහිදි දමිළ ජනතාවට ඒවා හිමි වුනා. ඒ වගේම මට මතකයි 1992 දී රජය විසින් මේ වතු පෞද්ගලිකකරණය කරන්න කටයුතු කරා. ඒකට විවිධ සමාගම් රජය සමග ඒකාබද්ධ වුණා. හැබැයි එම සමාගම් වතු කරේ ජනයාගේ සුභසාධනය බාරගන්න අකමැති වුණ නිසා රජයේ ඒවා පාර ගන්නං කිව්වා. හැබැයි මේ වෙනකම් වතුකරේ අයට ඒවාට සාධාරණයක් ඉටු වුණේ නැහැ" (හිටපු ග්‍රාමසේවක නිලධාරී පුරුෂ, අවු: 61).

ඒ අනුව පෙනී යන්නේ රජය ද බොහෝ විට වතුකරයේ ජනතාව කෙරෙහි දක්වන අවධානය සීමිත බවයි. නමුත් වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය උපයන ප්‍රධාන පුරුකක් බවට පත්ව සිටින කොටස් අතර මෙම වතුකර ජනතාව ප්‍රමුඛත්වය ගනු ලබයි. ඔවුන් ඔවුන්ගේ මුළු ජීවිත කාලයම මෙම වතුකරයට දිය කරමි තේ දළු නෙලමින් රටට විදේශ විනිමය ලබා ගැනීමට කටයුතු කරයි. එහිදී ඔවුන්ගේ ශ්‍රමයට සරිලන ආදායමක් ලැබෙනවාද යන්න ප්‍රශ්නාර්ථයක් මතු වේ.

මෙම වතු කම්කරුවන්ට වැටුප ලෙස දිනපතා ලැබෙනුයේ කාන්තාවන් සඳහා රුපියල් 800ක මුදලකුත් පුරුෂයින් සඳහා රුපියල් 1000ක මුදලකුත් ය. මෙලෙස ලැබෙන දෛනික වැටුපෙන් ඔවුන් ඔවුන්ගේ දෛනික ජීවිතයේ කටයුතු මෙන්ම දරුවන්ගේ කටයුතු සිදුකිරීමට සිදුවී ඇත. බොහෝවිට මෙය ස්වාමිපුරුෂයා නැතිවූ කාන්තාවක් හට රුපියල් 800ක මුදලින් සියලු කටයුතු සිදු කිරීමට නොහැකි බව වැටහී යයි. ඉහත සඳහන් කරනු ලැබූ ලයිම් නිවාසවලින් මෙම ජනයා වෙන් නොවීමටද හේතුවක් ලෙස මෙය පෙන්වා දිය හැකිය. නමුත් ඔවුන් ඔවුන්ගේ ශ්‍රමය සම්පූර්ණයෙන්ම මෙම වතුකරය වෙනුවෙන් යොදවනු ලබයි. නමුත් ඔවුන් ශ්‍රී ලංකාව තුළ සිදු වූ බෝම්බ ප්‍රහාරය සිදුවූ කාලයේදීත් කොවිඩ්-19 තුළදීවත් ඔවුන්ගේ රාජකාරිය සිදු නොකර සිටියේ නැත. ඔවුන් දිගින් දිගටම ඔවුන්ගේ සේවය රට වෙනුවෙන් ලබාදී ඇත. නමුත් තවමත් ඔවුන්ගේ දෛනික ආදායම ඔවුන්ගේ ශ්‍රමයට යෝග්‍යද යන්න ගැටලුවකි. ඇතැම් විට ඔවුන්ට රාජකාරි සඳහා පැමිණීමට නොහැකි වුවහොත් එදින වැටුප් නොලැබීම සිදුවේ. අතීතයේ ප්‍රසූතදීමනා ඔවුන්ට ලැබුණද වර්තමානය වන විට එම දීමනා සීමා වීම සහ එම පනත් ඒ අයුරින්ම ක්‍රියාත්මක නොවීම සිදුවේ. ඔවුන්ට ප්‍රසූත නිවාඩු මාස තුනද ඒ ආකාරයෙන්ම නොලැබෙන බව සඳහන් වේ. ලංකාව තුළ තිබෙන අනෙකුත් ක්ෂේත්‍රයන්

දෙස බැලීමේදී ඒවා තුළ රාජකාරි සිදු කරන සේවකයන්ට ලබා දෙන මූලික අයිතිවාසිකම් පවා මොවුන්ට අහිමි වීම සිදු වුවද මොවුන්ගෙන් ශ්‍රමය සූරාකෑමට ලක් වීම සිදුවන බව පැහැදිලි වේ. මේ හේතුවෙන් රජය මැදිහත් වීම සහ අවධානය මෙම ප්‍රජාව කෙරෙහි දැක්විය යුතු බව පැහැදිලි වේ.

ඊට හේතුව වන්නේ ඔවුන් දිනපතා රැකියාවල නිරත වුව ද තවමත් ඔවුන් අඩි (10×12) ලයිම් කාමරයක ජීවත් වීමත්, යටිතල පහසුකම් ලබා ගැනීමට නොහැකිවීමත්, අධ්‍යාපන සෞඛ්‍ය යන ප්‍රධාන ක්ෂේත්‍රයන් සඳහා ප්‍රවේශ වීමට නොහැකි වීමත් යන කාරණාවන් නිසා වෙනි. මෙලෙස මෙම ප්‍රධාන කාරණාවන් ඉටුකර ගැනීමට නොහැකියාව පවතින හේතු සාධකයක් ලෙස සඳහන් කළ හැක්කේ වතු කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආර්ථික සහ සහ ජීවනෝපායන් යන අයිතිවාසිකම්වලින් වෙන්ව පවතින බැවිනි. කෙසේ නමුත් වර්තමානය වන විට වතුකරේ කම්කරුවන්ගේ වැටුප වැඩිවීම සම්බන්ධව කිසිදු ප්‍රතිපත්තියක් හෝ දේශපාලනික සංවාදයක් ගොඩ නැගී නොමැති වීම මෙම කම්කරුවන්ට දිනපතා ලැබෙන සුළු මුදලින් ජීවත්වීමට සිදුවීම හරහා ඔවුන්ගේ පවුල් තුළ ප්‍රධාන ආහාර වේල් තුනෙන් එක් ආහාර වේලක් ලබා ගනිමින් එදිනෙදා ජීවිතය ගැට ගසා ගන්නා බවත් ඒ හරහා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා සීමා කිරීමට සිදු වී ඇති බවත් තවමත් ඔවුන් අඳින ඇඳුමේ සිට නිවසේ සියලුම භාණ්ඩ ඉතාම පැරණි භාවිතයට නොසුදුසු  තත්වය තිබෙන දේ පවා භාවිත කිරීමට සිදු වී ඇති බවත් තොරතුරු තුළින් හෙළි විය.

> "අපිට හම්බෙන්නේ 800ක සොච්චමක්. ඉතින් අපි කොහොමද ඒකෙන් මේ ආර්ථිකයත් එක්ක හැප්පෙන්නේ. අපි ඉතින් එක වේලක් කාලා ජීවත් වෙන්න තමයි ඉතින් දැනට උත්සාහ කරන්නේ" (කාන්තාව, අවු: 55).

අනුප්‍රාප්තික ආණ්ඩුව විසින්  විසඳාගත නොහැකි සමාජ සහ ආර්ථික රෝග රැසක් ඇත. එම දුබල ජීවන තත්වයන් ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් සහ අධ්‍යාපන පහසුකම් ලබාදීමට නොහැකි වීම වේ. ප්‍රධාන වශයෙන් මෙම දුර්වලතාවයන් ඇතිවීමට සහ අවුරුදු 200 ගත වූවත් මෙම ප්‍රජාව තවමත් එකම දුර්වල ජීවන මට්ටමක සිටිනුයේ ඔවුන් සඳහා නිසි ජාතික සංවර්ධන වැඩපිළිවෙලක් නොමැති වීම නිසා ය. එනම් ශ්‍රී ලංකාව තුළ පැවති සියලුම රජයන් විසින් මෙතෙක් ජාතික සංවර්ධන වැඩපිළිවෙලවල් ඓතිහාසික වතුකරයේ ජනතාව ඉවත් කරමින් සිදු කිරීම හේතුවෙන් වතුකර ජනතාවට නවාතැන් පහසුකම්, සෞඛ්‍ය පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් මෙන්ම අධ්‍යාපනික පහසුකම් ලබා ගැනීමට තවමත් දුෂ්කර වී ඇත.

1972 වතු ජනසතු කිරීම සඳහා වැඩපිළිවළක් සකස් කරන ලද අතර එහිදී අධ්‍යාපනය වැනි රාජ්‍ය සේවාවන් වතු ප්‍රජාවට ලබා දීමට කටයුතු කර ද එහිදී පළාත් පාලන සේවා, ප්‍රධාන සංවර්ධන සේවා

මෙම ප්‍රජාවට ව්‍යාප්ත වී නොමැත. එමෙන්ම 1992 දී රජය ඉහත සඳහන් කරන ලද ආකාරයට වතු පෞද්ගලිකකරණය කිරීමෙන් පසු මේ සියලුම වරප්‍රසාද මෙම වතුකරේ දමිළ ජනයා හට අහිමි වී ඇත. ප්‍රාදේශීය සභාවන් 33 වැනි වගන්තිය මගින් තේරී පත් වූ මන්ත්‍රීවරුන්ට ප්‍රාදේශීය සභා අරමුදල් යොදා ගනිමින් වතුකරය තුළ සංවර්ධනය කටයුතු කිරීමට පවතින බලය වළක්වා තිබුණද එය 2018 වන විට වනවිට අංක 30 දරණ ප්‍රාදේශීය සභා (සංශෝධිත) පනත හරහා සංශෝධනය කර ඇත. (හිටපු ග්‍රාමසේවක නිලධාරී පුරුෂ, 61). නමුත් තවමත් ප්‍රාදේශීය මට්ටමින් ද මෙලෙස මලෛයග දමිළ ජනයා හට ඔවුන්ගේ අයිතීන් දිනා ගැනීමට අවම වශයෙන් ඵලදායී ජීවනයක් එදිනෙදා ගත කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සිදු නොවන බවට පෙන්වා දිය හැකියි. මෙයට හේතුව වන්නේ ප්‍රජාව සම්බන්ධව ගනු ලබන සංවර්ධන තීරණ සහ භාවිත කරන ක්‍රමවේදයන් තුළ හඳුනාගත හැක්කේ ප්‍රජාව පිළිබඳ අනවබෝධයක් සහිත හාන්සි පුටු තීන්දු හා ක්‍රමවේදයන් වීම බවයි.

ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලබන කාර්යයන් තුළින්ම මෙම දමිළ ජනයා ආන්තිකරණයට ලක් වී ඇති බවට මෙන්ම ඔවුන්ට ලැබී ඇති පුරවැසි අයිතිය බිඳවැටෙන තවත් ප්‍රධාන කාරණයක් බවට පත් වන්නේ මෙලෙස දමිළ ජනයා සිටින වතු ප්‍රදේශය සඳහා සිටින රාජ්‍ය නිලධාරීන් තුළින් බොහෝ පිරිස් දෙමළ කතා කතා කිරීමට නොදන්නා නිළධාරීන් වීම ප්‍රධාන ගැටලුවකි. එහිදී වතුකරයේ දමිළ ජනතාව මෙන්ම එම රාජ්‍ය නිලධාරීන් අතර සිදුවන සංවාදයන් පාර්ශව දෙකටම වටහා ගැනීමට නොහැකි වීම මත ඔවුන් සඳහා පවතින ගැටළු රජයට දැනුම් දීමට නොහැකිවීම පිළිබඳව ප්‍රධාන වශයෙන් ගැටලු සහගත තත්ත්වයක් පවතී. එනම් වතුකරයේ ජනතාවට සිංහල භාෂාව නොතේරීමත්, ඒ හරහා ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉල්ලීම් ප්‍රකාශ කිරීමට නොහැකිවීමත් ඔවුන් සඳහා දක්වන නොසැලකිල්ලක් ලෙස සඳහන් කළ හැකිය. එමෙන්ම මෙය රජය මූලික වී මෙම ප්‍රදේශයන් සඳහා සුදුසු ඔවුන්ගේ දමිළ භාෂාව හැසිරවීමට හැකි නිලධාරීන් පත් කිරීමට කටයුතු සිදු කළ හැකි වුවද රජය ඒ සඳහා උනන්දුවක් නොදැක්වීම දක්නට ලැබේ. එම ජනතාවගේ මූලික අයිතිවාසිකම් කඩ වීමක් දක්නට ලැබේ එමෙන්ම එම නිලධාරීන්ට රජය විසින් ලබාදෙන දීමනා වරප්‍රසාද මෙන්ම රජයේ පවතින ඉදිරි දැක්ම නිසියාකාරව දමිළ ජනතාවට සන්නිවේදනය කිරීමට නොහැකි වීම හරහා මෙම ජනතාවගේ ආර්ථික දේශපාලනික සංස්කෘතික යන පැතිකඩයන්ගේ සංවර්ධනය කරා ගෙන යාම ඉතාම දුෂ්කර කාර්යයක් බවට පත් වෙයි. එනම් මෙයට හොඳම උදාහරණය වන්නේ,

> " සමහරු සමෘද්ධි, සමෘද්ධි කියනවා අපි ඒ මොකක්ද කියලවත් දන්නේ නැහැ" (පුරුෂ, අවු: 47).

ඉහත සඳහන් කරන ලද ආකාරයට රජය විසින් දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාවට ලබාදෙන වරප්‍රසාදයන් පිළිබඳව ඔවුන් දැනුවත් නොවීම ඔවුන් වර්තමානයේ තුළ තවමත් ඌණ සංවර්ධනයත්

පෙන්නුම් කිරීමට ප්‍රධාන හේතු සාධකයක් ලෙස සඳහන් කළ හැකිය. එමෙන්ම රජයේ ද මෙම සමෘද්ධි සහනාධාරයක් ලබා දීමට උත්සහ කරන්නේ නගරබද හෝ ගම්බද ප්‍රදේශයන් තුළ ජීවත් වන ජනතාවට පමණක් යන වග ඉහත සඳහන් පාඨය හරහා තේරුම් ගැනීමට හැකියාව ලැබේ. රජය විසින් සැබෑ දරිද්‍රතාවෙන් සිටින ජන කොට්ඨාසයන් කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීමත්, ඒ පිළිබඳව ඔවුන්ට නිසි අවබෝදයක් නොමැති වීමත්, රටේ අනෙකුත් පුරවැසියන්ට මෙලෙස සමෘද්ධි ණය, අස්වැසුම යනාදි විවිධ ණය පහසුකම් ලබාදීමට කටයුතු කිරීම හරහා සත්‍ය වශයෙන්ම මෙවැනි ණය සහ වරප්‍රසාදයන් හිමිවියයුතු කොට්ඨාසයට නොලැබීම හරහා ඔවුන් සිටින දරිද්‍රතාවයෙන් මුදවා ගැනීමට දුෂ්කර වීම තව තවත් තීව්‍ර වේ.

එමෙන්ම මෙහිදී පවතින රාජ්‍ය මට්ටමේ දුර්වලතාවයක් වන්නේ රජය විසින් පුරවැසි අයිතීන් පිළිබඳව දැනුවත් නොකිරීම මෙන්ම ඒ ඒ ජන කොට්ඨාසයන් සඳහා සුදුසු නිලධාරීන් පත් නොකිරීමයි. මේ හරහා ඔවුන්ට ඔවුන්ගේ අවශ්‍යතාවයන් ප්‍රකාශ කර ගැනීමට නොහැකිව ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවක් ලෙස සිටිමින් දරිද්‍රතාවය තුළින් හෙම්බත් වෙමින් ජීවත් වීමට ඔවුනට සිදුවේ.

> "අපිට State වලින් E කියන අකුරක් ඉස්සර කරන් Estate කියලා දාලා සමාජය තුළින් කොන් කරල දාල තියෙන්නෙ" (පුරුෂ, අවු: 42).

එමෙන්ම වතුකරයේ දමිළ ජනතාව මෙම පෞද්ගලිකකරණය වූ වතු වෙත යෑමේ දී ඔවුන්ට වේතනයක් ගෙවීම අවම බව ඉහත කරුණු හරහා සාකච්ඡාවට ලක්විය. එමෙන්ම මෙලෙස මොවුන් වතු ආශ්‍රිතව ජීවත් වන බැවින් ඔවුන්ට එම රැකියාවන් හරහා කීර්ති නාමය වෙනුවට කුලී ශ්‍රමිකයන්, තේ දළු කඩන්නන්, වත්තේ වැඩ කරන්නන් ලෙස නාමයන් පටබැඳී ඔවුන් පහත් කුලය හෝ පහළ සංස්කෘතික ජන කොට්ඨාසයක් ලෙස බලමින් තවමත් වර්තමාන සමාජය හරහා ඔවුන්ව ලේබල් කිරීම සිදුවේ.

ඒ අනුව මොවුන්ට සමාජයීය සහ ආර්ථික වශයෙන් හිමිවිය යුතු සමාජ තත්ත්වයන් ඉතාමත් පහල මට්ටමක් බැවින් සමාජය තුළ උසස් තත්ත්වයකට යෑමට ඔවුන්ට නොහැකි බව සෘජුව පෙනෙන කාරණයක් බවට පත්වී ඇත. මෙලෙස වතු ආශ්‍රයෙන් දිගින් දිගටම රැකියාවේ නියැලෙන ඔවුන්ට පෞද්ගලික වශයෙන් හෝ දියුණු වීමට ඇති ප්‍රවේශයන් සියල්ල අහිමි වී යන්නේ රජයේ දක්වන දායකත්වය ඇති දුර්වලතා මත බව ඉහත කරුණු හරහා පෙනීයයි.

එමෙන්ම රාජ්‍ය නොවන ආයතනයන්ද මෙම මලෙයග දමිළ ජනයාගේ අවශ්‍යතා සොයා බැලීම සිදු කර ද ඒ සඳහා නිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට හෝ ඒ සඳහා පෙළඹවීමක් කිරීමට කටයුතු නොකරයි. එමෙන්ම සෘජුවම වතුකරයේ ජනතාවගේ මෙලෙස සමාජීය, ආර්ථික, දේශපාලනික ගැටළු

දිගින් දිගටම සාකච්ඡා කරමින් සිටිය හැකි නමුත් එහිදී ද ක්‍රියාත්මක වන වැඩපිළිවෙළක් ඉදිරිපත් නොවුවහොත් මෙලෙස දිගින් දිගටම මෙම ජනතාව ඌන සංවර්ධිත ජන කොට්ඨාසයක් ලෙස ශ්‍රී ලංකාව තුළ සිටීමට පවතින වපසරිය පුලුල් වේ.

**මලෙයගු දමිළ ජනතාවගේ භූමිකාව හා සංවර්ධන ගැටලු**

ලංකාව තුළ පුරවැසිභාවය ලබා ගත්තද ඔවුන් ජීවිත කාලය පුරා වතු කම්කරුවන් ලෙස රැකියාවන් තුළ නිරත වුවද ඔවුන්ගේ ජීවිතය දක්නට ලැබෙන්නේ දරිද්‍රතාවයෙන් පිරි සමාජ කොට්ඨාසයක් ලෙසයි. එමෙන්ම ප්‍රධාන වශයෙන් මේ සඳහා සෘජුවම රජයේ පවතින දුර්වලතා හා අවධානය අවම වීම මෙන්ම මෙලෙස දමිළ ජනයා තුළ පවතින දුර්වලතාවයන් සහ සංවර්ධනය සඳහා උනන්දුව දැක්වීම සහ ඔවුන් බලගැන්වීම සිදුනොවීම ප්‍රධාන කාරණාවන් ලෙස ඉදිරිපත් කළ හැකිය.

ඒ අනුව සමාජයීය ආර්ථික, දේශපාලනික සහ සංස්කෘතික වශයෙන් ඔවුන් ආන්තිකරණය වී ඇති බවත් අවුරුදු 200 යන තුරුත් ඔවුන් ජීවිතය ආරම්භ කරන ලද ස්ථානය තුළ සිටීම මොවුන් තුළ පවතින දුර්වලතා හඳුනා ගැනීම සමාජීය වශයෙන් ඔවුන්ගේ දියුණුවට යෝජනා ඉදිරිපත් කළ හැකි මාර්ගයක් බවට පත් වෙයි. ඒ අනුව මොවුන් තුළ පවතින දුර්වලතා ආකාර කිහිපයක් යටතේ හඳුනාගත හැකිය.

1. සමාජීය දැනුවත් භාවය අවම වීම
2. සමාජානුයෝජනය සිදු කරන ආකාරය පවතින දුර්වලතා
3. සංස්කෘතිය

**සමාජීය දැනුවත් භාවය අවම වීම**

ඉහත කාරණා ඔස්සේ මෙම මලෙයගු ජනතාව තවමත් ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවක් ලෙස සිටීමට හේතු සාධකයන් විමසීමට ලක් කළ හැකිය. පුරවැසියන් ලෙස ශ්‍රී ලංකාව තුළ සිංහල, දමිළ සහ මුස්ලිම් ජන කොට්ඨාසයන් සියලු දෙනාම එක හා සමානව සියලුම අයිතිවාසිකම් ලැබීම සිදු විය යුතුයි. එමෙන්ම දරිද්‍රතාවය පවුල් සඳහා ලබාදෙන සියලුම සහනාධාරයන් එක හා සමානව ලැබීම සිදුවිය යුතුයි. නමුත් අනෙකුත් ජන කොට්ඨාසයන්ට සාපේක්ෂව මෙම මලෙයගු දමිළ ජනතාවගේ සමාජ දේශපාලනික දැනුවත් භාවය අවම මට්ටමක පවතී. එයට හේතුව වන්නේ ඔවුන්ගේ ලයිම් නිවාස තුල ඇතැම් විට සමාජ තොරතුරු දැනගැනීමට හැකි සන්නිවේදන මෙවලම් නොමැති වීම සහ ප්‍රධාන වශයෙන් රටේ බහුතරයක් දෙනා භාවිත කරන සිංහල භාෂාව හැසිරවීමේ අපහසුතාවය මත ඔවුන්ට සමාජීය වශයෙන් පවතින දැනුවත් භාවය අවම වේ. මේ හේතුවෙන් ඔවුන්ට ශ්‍රී ලාංකික

පුරවැසියන් වශයෙන් ඇති අයිතිවාසිකම් මොනවාද යන්න පිළිබඳව රජය මගින් ලබාදෙන විවිධ දීමනා පිළිබඳව අවබෝධයක් නොමැතිවීමත් සහ ඒවා පිළිබඳ උනන්දුවක් නොමැති වීම හේතුවෙන් මොවුන් තවමත් දරිද්‍රතාවෙන් බැට කන ජනතාවක් බවට පත්ව ඇත.

එමෙන්ම රජයේ නිලධාරීන් පැමිණෙන තුරු බලා සිටිනවා හැර මොවුන් ඔවුන්ගේ අයිතීන් දිනා දිනාගැනීමට උත්සාහ නොකරන බවක් පෙනී යන්නේ නුවරඑළි සිටින අනෙකුත් ශ්‍රී ලාංකික පුරවැසියන් මෙන් ඔවුන් රජයේ නිලධාරීන් සමඟ කතා කොට ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉදිරිපත් නොකරන්නේ ඔවුන්ගේ අවශ්‍යතාවයන් රජයේ නිලධාරීන් නොසලකා හරිනවා යැයි ඔවුන් විසින්ම සිදුකර ගන්නා ලද පුරෝකථනයන් නිසාවෙනි. ශ්‍රී ලංකාව තුළ සමෘද්ධි ආධාර පිළිබඳව නොදන්නා කෙනකු නොමැති බව වැටහෙන්නේ ඒ පිළිබඳව දිගින් දිගටම ගොඩනැගෙන කතිකාවතයන් හේතුවෙනි. නමුත් මෙම වතු කෙරෙහි සිටින දමිළ ජනතාව මෙම සමෘද්ධි වරප්‍රසාදය කුමක්ද යන්න 2023 වර්ෂය වන විටත් නොදන්නා බව ඉහත සඳහන් කරන ලද කාරණාව සඳහා එක් උදාහරණයක් ලෙස පෙන්වා පෙන්වා දිය හැකිය.

එමෙන්ම මොවුන්ට එවැනි ආධාරයන් උපකාරයන් ලබා ගැනීමට හැකියාව තිබුනද ඔවුන් තුළ පවතින අවම සාක්ෂරතා මට්ටම හේතුවෙන් අදාළ ලියකියවිලි පිරවීමට නොහැකි වීම සහ ඒ වෙනුවෙන් කෙනෙකු සොයා ගැනීමට යාමේ දී ඔවුන්ට එම උත්සාහයන් අත් හරින බවත් ඒවා පිළිබඳව අවබෝධයක් නොමැති හෙයින් ඔවුන් ඒවා සඳහා අත්සන් තැබීමට බිය දක්වන බවත් ඇතැම් තොරතුරු හරහා අනාවරණය විය. ඒ අනුව ඔවුන්ගේ මෙම සාක්ෂරතා මට්ටම ද ඔවුන්ගේ අයිතීන් දිනා ගැනීමට හැකියාව ඇතත් පවතින අවම භාෂා දැනුවත් බව සහ අවම සාක්ෂරතා මට්ටම එයට හරස් වී ඇති බව සඳහන් කළ හැකිය.

> " අපිට දන්නෑ ලියන්න. මොනවද කොළ වගයක් තියෙනවා ඒවා පුරවන්න කියනවා. ඉතින් අපි ඒවා දන්නැති නිසා පුරවන්න බයයි. ඉතිං අපි සමහර දවසට ගිය පයින්ම ආපහු වෙනවා ඒවා පුරවන් නැතුව" (කාන්තාව, අවු:54).

ඒ අනුව පැහැදිලි වන්නේ පුරවැසි අයිතීන් දිනා ගැනීමට ඔවුන්ට දැනුම, අවබෝධය නොමැති වීම ප්‍රධාන අභියෝගයක් බවට පත්ව ඇති බවත්, ඒ හරහා ඔවුන්ගේ ජීවිතය සංවර්ධනය කර ගැනීමට පියවරක් ඉදිරියට යාමට ඔවුන්ට නොහැකි වී තිබෙන බවත් ය.

**සමාජානුයෝජනය සිදු කරන ආකාරය පවතින දුර්වලතා**


මීට අමතරව පුරවැසිභාවය හිමි වූවත් ඔවුන් තවමත් දරිද්‍රතාවයෙන් පෙළෙන ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවක් බවට පත්වීමට ප්‍රධාන සාධකයක් බවට පත්වන්නේ සමාජයානුයෝජනය පවතින දුර්වලතා යන්න ලබාගත් තොරතුරු තුළින් පෙන්වා දිය හැකිය. මෙම පුරවැසියන් සමාජානුයෝජනය සිදුකරන ක්‍රියාවලියේ පවතින දුර්වලතා පවුල, අධ්‍යාපනය, ආගම සහ රැකියාව යන කාරණාවන් හරහා හඳුන්වාදිය හැකිය. ප්‍රථමයෙන් පවුල තුළින් ලබාදෙන සමාජානුයෝජනය මෙම දමිළ ප්‍රජාව අතර පුළුල් පරාසයකට විහිදී නොයයි. එනම් ඔවුන් ලයිම් කාමර තුළ ගත කරන ජීවිතය ඒ ආකාරයෙන්ම පරම්පරා ගණනාවක් මෙන්ම අවුරුදු 200 සපිරුණු ද සිටීම ප්‍රධාන වශයෙන් පෙන්වාදිය හැකි උදාහරණයක් බවට පත්වේ. බොහෝ විට පවුල තුළින් භාෂාව ආගම සහ සමාජ ගත කිරීම සිදු කරනු ලබන්නේ අවම පරාසයකින්ය. එනම් එම ලයිම් කාමර තුළ සිටින පිරිස් අතර පමණක් සම්බන්ධතා පවත්වා ගැනීම, දරුවන්ට ලයිම් කාමර තුළින් එපිට සමාජය පෙන්වීමට ඒ සඳහා අවස්ථාව නොදීමට කටයුතු කිරීම, දරුවන්ට සමාජය දැනුම ලබා දීමට බිය වීම, දරුවන් අධ්‍යාපනය සඳහා නොව ඔවුන් දවසේ වැටුප සොයා ගැනීම සඳහා කුඩා වයසේදීම රැකියා සඳහා යොමු කිරීම සිදුකරන බව දත්ත තුලින් පැහැදිලි විය.

ප්‍රධාන වශයෙන් යටිතල පහසුකම් එනම් වැසිකිලි භාවිත කරන ආකාරය, පිරිසිදු පානීය ජලය භාවිත කරන ආකාරය, පිරිසිදුව ආහාර ලබා ගන්නා ආකාරය තමන් ජීවත්වන වටපිටාව පිරිසිදුව පවත්වා ගත යුත ආකාරය පිළිබඳව දැනුවත් කිරීම් ඉතා දුර්වල මට්ටමක පවතියි. ඒ අනුව පරම්පරා ගණනාවකටම විකාසනය වන්නේ ලයිම් කාමර ඉදිරියේම සියලුම සනිපාරක්ෂක කටයුතු සිදුකර ගැනීම, එම ස්ථානයේදීම ආහාර පිසීම වැනි කටයුතු සිදුකිරීමට හුරුවීමයි. කෙසේ නමුත් මෙලෙස ඔවුන් ඒවා ඔවුන්ගේ ජීවිතයට හුරු පුරුදු කරගෙන ඇති බැවින් ඉන් එහාට එලදායි ජීවිතයක් ගත කිරීමට උත්සාහ නොගනී. එමෙන්ම නුවරඑළිය යනු ස්වභාවික එළවළු පලතුරු ඇති සාරවත් ප්‍රදේශයක් වුවත් මොවුන් එම සාරවත් බවෙන් ප්‍රයෝජන නොගන්නා බවට පෙනී යන්නේ වර්තමානය වනවිට රජයේ වතුකර රැකියා කරන පවුල් සඳහා වියළි සලාකයක් ලබාදෙන බවත් එහිදී ඔවුන්ට ලැබෙන ආහාරවලින් ඔවුන් මාසිකව තමා ආහාර වේල ලබා ගන්නා බවයි. එම වියළි සලාකය තුළ පාන් පිටි, සීනි වැනි ආහාර පමණක් තිබීම හේතුවෙන් මොවුන් ඔවුන්ගේ දිනකට අනුභව කළ යුතු ආහාර සඳහා බහුලව රොටි අනුභවයට හුරුපුරුදු වී ඇත. ඒ අනුව ඔවුන්ට සහ විශේෂයෙන්ම දරුවන් සඳහා පෝෂදායී ආහාර වේලක් නොලැබීම මත මෙන්ම අපිරිසිදු වටපිටාවක් තිබීම හරහා රෝගයන්ට ගොදුරු වීම ඉක්මනින් ම සිදු වේ. එයට හේතුව වන්නේ ඔවුන් දිනකට ආහාර වේල් ත්‍රිත්වයම ලබා ගැනීමට නොහැකි වීම,

පෝෂදායී ආහාර නොලැබීම හේතුවෙන් ප්‍රතිශක්තිකරණය හීන වීම මෙන්ම ප්‍රධාන වශයෙන් වතුකර ළමා කණ්ඩායම මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් බවට පත්වීම මේ හරහා සිදුවේ.

" අපිට හම්බෙන සොච්චමෙන් කොහොමද වේල් තුනම කන්නේ එක වේලක් හරි දෙකක් හරි රොටියක් කාලා ඉන්නවා ඉතින්" (කාන්තාව, අවු:48).

රූප සටහන 01: වතු ප්‍රජාවේ සෞඛ්‍ය තත්වය




මූලාශ්‍රය: Institute of Social Development, 2023

මේ හේතුවෙන් ඇතැම්විට මාතෘ මරණ මෙන්ම ළමා මරණ අනුපාතය ද විවිධ රෝගයන්ට ගොදුරු වීම හරහා සිදුවන මරණ අනුපාතයන්ද වැඩි වීම සිදුවිය හැකිය. පූර්ව අධ්‍යයනය තුළින්ද හෙළිවූයේ අතීතයේ සිටම මෙම ප්‍රජාවගේ සමාජයේ ගැටලු ලෙස මේවා දීර්ඝ කාලීනව පැවතගෙන එන බවයි. මේ හේතුවෙන් මෙම වතු ප්‍රදේශය ආශ්‍රිතව එම ජනතාවට පිරිසිදු යටිතල පහසුකම් සැපයීම සහ පිරිසිදු පානීය ජලය ලබාදීම වැදගත් වේ. නමුත් ඇතැම් විට මෙලෙස ඔවුන්ට පෝෂදායි ආහාරවේල යටිතල පහසුකම් ලබාගැනීම මෙන්ම අධ්‍යාපනික පහසුකම් ලබා ගැනීමට නොහැකි වන්නේ ඔවුන් ජීවත්වන වතු ප්‍රදේශය තුළ ඔවුන්ට එදිනෙදා ජීවත් වීමට අවශ්‍ය ආහාර, භාණ්ඩ හෝ මුදල් ලබා ගත් විට එම ණය නැවත ගෙවීමට නොහැකි වූ විට ඔවුන් එම වතු ප්‍රදේශය අතහැර වෙනත් වතු ප්‍රදේශයකට ගමන් කිරීමට සිදුවන බවත් එහිදී ඔවුන්ගේ දරුවන්ට අඛණ්ඩව අධ්‍යාපන කටයුතු සිදු කිරීමට නොහැකි බවත්, ඔවුන්ට දිනකට ආහාර වේල් ත්‍රිත්වයම ලබාගැනීමට නොහැකියාව පවතින

බවත්, ඔවුන්ට යටිතල පහසුකම් ලබා ගැනීමට නොහැකි බවත් සඳහන් වේ. එමෙන්ම ඔවුන් එවිට අවිනිශ්චිත ජීවිතයක් භුක්ති විඳීමට සිදුවේ. එබැවින් ඔවුන්ට මෙලෙස පෝෂණය සහ සෞඛ්‍යාරක්ෂිත ගුණාත්මක (Quality of Life) ජීවිතයක් ගත කිරීමට නොහැකි බව ලබාගත් දත්ත අනුව පැහැදිලි වේ.

ඒ අනුව අධ්‍යාපනය නොලැබීම මෙම දමිළ ප්‍රජාව සංවර්ධනය නොවීමට බලපාන තවත් ප්‍රබල සාධකයක් ලෙස මෙහිදී හඳුනාගත හැකිය. එයට හේතුව වන්නේ පවුලේ වැඩිහිටි ප්‍රජාව අධ්‍යාපනය සඳහා යොමු නොවීම හේතුවෙන් ඔවුන් හට අධ්‍යාපනයේ පවතින වැදගත්කම සහ ඒ ඔවුන්ගේ ජීවිතය සංවර්ධනයට ඇති කළ හැකි බලපෑම පිළිබඳව නො දැනුවත් වීම හේතුවෙන් ඔවුන් ඔවුන්ගේ ඉදිරි පරම්පරාව හට ද අධ්‍යාපනයේ වැදගත්කම නිවැරදි ලෙස සමාජානුයෝජනය සිදු නොකරයි. මෙම දමිළ ප්‍රජාව සඳහා අතීතයේ අධ්‍යාපනික අයිතිය ලැබෙනුයේ අවුරුදු 6 සිට 10 දක්වා වූ දරුවන්ට පමණි. වයස අවුරුදු 10 න් පසු ඔවුන්ට වතුවල වැඩ කිරීමට සිදු වී ඇත. එම දරුවන් වතුකරයේ ළමා කම්කරුවන් ලෙස වැඩ කර ඇත. 1947 වන විට සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මහතා රටේ සියලුම දරුවන්ට නිදහස් අධ්‍යාපනය සහතික කිරීම සඳහා පනතක් ගෙන ආ නමුත් වතුකරයේ දරුවන්ට එම නිදහස් අධ්‍යාපනය අහිමි විය. නමුත් වර්තමානය තුළ සියලුම දරුවන්ට නිදහස් අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වුවද පුරුද්දක් වශයෙන් වතුකරයේ ජනතාවගේ දරුවන්ගේ අධ්‍යාපනය අවුරුදු 10 හෝ සාමාන්‍ය පෙළ දී නතර කිරීමට කටයුතු කරයි.

ලබාගත් දත්ත අනුව පැහැදිලි වූයේ ඔවුන්ට උසස් අධ්‍යාපනය සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැති බවයි. එනම් ඔවුන් සිතනුයේ උසස් අධ්‍යාපනය තුළින් A සාමාර්ථ පමණක් ලබාගන්නා අයට විශ්වවිද්‍යාලය සඳහා ප්‍රවේශයන් ලැබීමත් හෝ වෙනත් පාඨමාලාවක් කිරීමට හැකියාවක් ඇති බවයි. එමෙන්ම මූලික වශයෙන් ශ්‍රී ලංකාව තුළ පවතින නව විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුවත්භාවය අවම වීමද මෙයට ප්‍රධාන ගැටලුව බවට පත්වෙයි. මෙම අධ්‍යාපනික ක්‍රියාවන් සඳහා වතුකරයේ ළමුන් බලගැන්වීම දෙමව්පියන් විසින් සිදු නොකරන්නෙ අධ්‍යාපනය සඳහා ඔවුන්ට වියදම් කිරීමට තරම් ප්‍රමාණවත් මුදල් නොලැබීමත්, අධ්‍යාපනය සිදු කරන කාලය තුළදී වතුවල රැකියා කරමින් මුදල් ඉපයීම වඩාත් යෝග්‍ය බවත් ඔවුන් තරයේ විශ්වාස කරන බැවිනි. මේ අනුව වතුකරේ සිටින සාමාන්‍ය ජනතාවගේ දරුවන් අධ්‍යාපනය මග නතර කරමින් රැකියාවන්වලට යොමු වේ. නමුත් වතුකරයේ වර්තමානය වන විට අධ්‍යාපන ක්ෂේත්‍රයේ හෝ වෙනත් ක්ෂේත්‍රවල නියුතු එනම් ගුරුවරුන්ගේ දරුවන් පමණක් උසස් අධ්‍යාපනය සහ විශ්ව විද්‍යාල අධ්‍යාපනයට ප්‍රවේශ වීමක් දක්නට ලැබේ.


> "මගේ මව ගුරුවරියක්. ඒ නිසා මම ඉන්න වතුකරේ විශ්වවිද්‍යාලයකට ගිය පළවෙනි කෙනා මම. මට හිතෙන්නේ ගොඩක් අය උත්සහ කරන්නේ නැහැ ඉගෙනගන්න. එයාල හිතන්

ඉන්නේ A ගත්ත අයට විතරයි කැම්පස් යන්න පුළුවන් කියලා. අනික් ගොඩක් අය මුදල් හම්බ කරන්න හුරු වෙලා නිසා අධ්‍යාපන කටයුතු කරන්න කැමති නැහැ" (කාන්තාව, අවු: 28).

මෙහිදී පැහැදිලි වන්නේ රජය විසින් මෙම වතු ජනතාවගේ අධ්‍යාපනය සඳහා අවම අවධානයක් ලබා දෙනවා සේම එම ජනතාවගේද අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කර ගැනීම සඳහා උනන්දුවක් නොමැති බවයි මොවුන්ට රජයේ වැදිහත්වීමක් සිදු නොවුවද ප්‍රජාවක් ලෙස සව්වල ගැන්වී එක් එක් වතු ප්‍රදේශය තුළ සිටින ලිවීමට කියවීමට හැකි පුද්ගලයකු මගින් තමන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමට ඔවුන් විසින්ම ක්‍රමවේදයක් සකස් කර ගැනීමට උත්සාහ කරන්නේ නම් ඇතැම් විට රජයේ සහයද ඇතිව ඔවුන්ට අවශ්‍ය අධ්‍යාපන පහසුකම් ලබාදීමට හැකියාව පවතී නමුත් සිදු වන්නේ මොවුන් අධ්‍යාපනය නොසලකා හැරීම මත දැනුම තුළ පවතින දුර්වලතාවයත් ඒ තුළින් සමාජ බලය නොමැති වීමක් මෙන්ම ඒ හරහා හඬක් නැගීමට, සමාජය තුළ ඔවුන් වෙනුවෙන් කථිකාවතක් ගොඩනැගීමට නොහැකි වීමත් ඒ හේතුවෙන් ඔවුන්ගේ ජීවිතය තුල සංවර්ධනයක් ඇති කර ගැනීමට අවශ්‍ය මාර්ගයන් අවහිරවීම සිදුවීමත්ය.

වතුකරයේ මුල් ළමාවිය සංවර්ධනය සඳහා ළමුන් යොමු වීම නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවට වඩා වැඩිවේ. (Primary Grade 1-5, Estate 39.6) එමෙන්ම ද්වීතික අධ්‍යාපනය (Secondary School Grade 6-10 Estate 41.8) වතුකරයේ ළමුන් නාගරික සහ ග්‍රාමීය මට්ටම සමග සමඟ සමව පවතී සාමාන්‍ය පෙළ දක්වා යාමේ දී සැලකිය යුතු පහත බැසීමක් වතුකරයේ දරුවන් තුළ අධ්‍යාපනය සඳහා යොමු යොමු වීම දක්නට ලැබේ ප්‍රමාණය 5.4 ලෙස සඳහන් කළ හැකිය එමෙන්ම උසස් පෙළ සිට ඉහලට ඉහලට යාමේදී අධ්‍යාපනික වශයෙන් විශාල පහළ බැසීමක් පෙන්නුම් කරයි එය 3 දක්වා පහත වැටේ (Household income expenditure survey, 2016).

රූප සටහන 02: වතු ප්‍රජාවේ අධ්‍යාපන තත්ත්වය




මූලාශ්‍ර: Household Income Expenditure Survey, 2016

ඒ අනුව වතුකරයේ දෙමව්පියන් අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔවුන්ගේ දරුවන්ට ධනාත්මක සමාජ සමාජානුයෝජනය සිදු නොකරන බව ඉහත දත්ත ඔස්සේ පැහැදිලි වේ. නමුත් සිදු කළ යුත්තේ වයස අවුරුදු හයේ සිට උසස් පෙළ දක්වා නිවැරදිව දරුවන්ට අධ්‍යාපනය ලබාගැනීමට අවස්ථාව සැකසීමයි. එහිදී බොහෝ විට එම පරම්පරාව තුළින් හෝ සංවර්ධනය කරා යාමට මෙන්ම ධනාත්මක ආකල්පයන් වර්ධනය කරගැනීම, මෙන්ම එය හරහා ඵලදායි ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සන්දර්භය ගොඩනැගීමට මෙන්ම, ස්වයං රැකියාවන් සිදු කිරීමට, එමෙන්ම විවිධ රැකියා ක්ෂේත්‍රයන් පිළිබඳ පුළුල් දැනුමක් ලබාගැනීම, නව විෂයන් පිළිබඳව පුළුල් දැනුමක් ලබා ගැනීම හරහා දෙමව්පියන් මෙන්ම ඔවුන්ගේ ජීවිතය තුළ ද සංවර්ධනයක් ඇති කිරීමට මෙම අධ්‍යාපනයේ ඇති වටිනාකම පිළිබඳව දැනුවත් කිරීම වැදගත් වේ. එය දෙමාපියන් විසින් සිදු නොකරන්නේ නම් දරුවන් අධ්‍යාපනය සඳහා යොමුවන කාලසීමාව තුළදී ද අධ්‍යාපනයේ වටිනාකම කියා දෙමින් ඒ සඳහා ඔවුන්ව බලගැන්වීම කිරීම මෙන්ම විශේෂයෙන්ම ඔවුන්ගේ භාෂාව හසුරුවීම එනම් රටේ ප්‍රධාන භාෂාව හැසිරවීමට දැනුවත්භාවයක් ලබාදීම වැදගත් වේ.

වතුකරයේ අධ්‍යාපනික කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් පහසුකම් ප්‍රමාණය රජය තුළින් මොවුන්ට ලබා නොදීමත් ගුරුවරුන් ඇතුළු අවශ්‍ය පොත්පත් භාණ්ඩවල හිඟය හේතුවෙන් ඔවුන්ට අධ්‍යාපනය සඳහා ධනාත්මක පෙළඹවීමක් ඔවුන් වෙත කිරීමට අපොහොසත් වී ඇති බව දත්ත තුළින් පැහැදිලි වේ. මේ හේතුවෙන් දරුවන්ට අධ්‍යාපනය සම්බන්ධයෙන් ධනාත්මක සමාජානුයෝජනය සමාජය තුළින් ලබා දෙන්නේ නම් එක් පරම්පරාවකින් හෝ වතුකරේ සංවර්ධනය නගා සිටුවීමට මෙන්ම යහපත් ඵලදායි

ජීවන තත්ත්වයක් ඇති කිරීමට අවස්ථාව ඔවුන්ට ලබාදිය හැකිය. එයට ඔවුන්ගේ ඍණාත්මක උපකල්පනයන් ඉවත් කිරීම කළ යුතුයි.

මීට අමතරව ඔවුන්ගේ ජීවිතය වතු ආශ්‍රිතව පමණක් ගොඩනගා ගැනීමට උත්සාහ කිරීමේදී දෛනිකව ඔවුන් තේ දළු නෙලීමට සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා පමණක් අවධානය යොමු කරමින් කටයුතු කරයි. ඉන් එපිට ඔවුන් ව්‍යවසායකයන් වීමට හෝ ස්වයං රැකියාවක නිරත වීමට දක්ෂතා තිබුණද ඒවා තුළින් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන බොහෝ වතුවල රැකියා සඳහා ගමන් කරයි.

> " මට දැන් අවුරුදු 65 මට හොඳට දෙමළ ජන ගී ගායන හා නර්තන හැකියාවක් තිබුණා. මම ඒවට හරි ආස වුණා. ඒත් ඒකෙන් ඉදිරියට යන්න බැරි වුණා. තිබ්බ ආර්ථික ප්‍රශ්නයි සාම්ප්‍රදායික කාන්තාවක් තේ දලු කඩන්න යොමු වෙලා තිබ්බ නිසා ගෙදරින් බලපෑම් කළේ ඒ රැකියාවට. ඒ නිසා ඒ රැකියාව සිදුකර නමුත් මට දැන් ඒ රැකියාව කරන්න අමාරුයි. දැන් මම ජන ගී ගායනා කරලා සතුටු වෙනව දැන් ඒ සඳහා දරුවන්ගෙන් උපකාර සහ නිදහස ලැබෙනවා" (කාන්තා, අවු: 65).

එමෙන්ම වර්තමානයේ සිටින තරුණ පිරිස් වෙනත් රැකියාවන් සඳහා කොළඹ වැනි නාගරික ප්‍රදේශවලට පැමිණියද ඔවුන්ට එහිදී පවතින ආර්ථික ගැටළු හමුවේ වැඩිවන මිල ගණන් හමුවේ ආහාර මිල ඉහළ යාම, නවාතැන් පහසුකම් නොමැතිවීම හේතුවෙන් එම රැකියාවන් අත්හැර දමා නැවතත් වතුකරය වෙත යාමට උත්සහ කරයි. ඒ අනුව දත්තදායකයන් සඳහන් කරන ලද්දේ වතුකරේ සිට පැමිණි බව දැනගත් පසු වේතන සාකච්ඡා කිරීමේදී ඉතාම අඩු මුදලක් ලබාදීමට ඔවුන් පෙළඹෙන බවයි.

> "මම කොළඹ රැකියාවකට ගියා. ඊට පස්සේ නවතින්න තැනයි, කෑමටයි, බීමටයි මුදල් ගියාම මට කීයක්වත් ඉතිරි වෙන්නෑ. එයාලා අපි දෙමළ වතුකරය අය නිසා අඩු පඩියට වැඩ ගන්නෙ ඉතින් ඊට වඩා වතුකරේ වැඩ කරන එක හොඳයි කියලා හිතලා මම මෙහෙ ආවා". (පුරුෂ, අවු: 38).

මේ ආකාරයට වතුකරයේ තරුණයින් ද ඔවුන්ගේ සමාජ පරිසරයෙන් වෙන්ව ගොඩනැගීමට උත්සහ කිරීමේදී වතුකරයේ ජනතාවගේ ඌන සංවර්ධිත ස්වභාවය, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පවතින දුර්වලතාවයන් හේතුවෙන් ලේබල් ගැසීම සිදු කරමින් ඒ තුළින් ප්‍රයෝජන ගැනීමට උත්සාහ දැරීමද ඔවුන්ගේ ජීවිතය සංවර්ධනය කරා ගෙන යාම තවදුරටත් දුෂ්කර කාර්යයක් බවට සමාජය තුළින් ද පත් කරනු ලබයි.

## සංස්කෘතිය හා දේශපාලනය

එමෙන්ම මීට අමතරව මලෛයග දමිළ ජනතාව සංවර්ධනය නොවී ආරම්භක ස්ථානයේම තවමත් සිටීමට හේතුව වන්නේ ඔවුන්ගේ සංස්කෘතියයි. ඔවුන් ඔවුන්ගේ ජීවත් වන සමාජය තුළින් මෙන්ම ඔවුන්ගේ සංස්කෘතිය තුළින් වෙනත් සංස්කෘතීන් වෙත අනුගත වීමට දක්වන බිය ප්‍රධාන වේ. මෙහි සමාජවිද්‍යාත්මක හැඳින්වීමේදී සංස්කෘතික තිගැස්ම, සංස්කෘතික කම්පනය ලෙස සඳහන් කළ හැකිය. මලෛයග දමිළ ජනයා වතුකරයේ මුල්බැස ගනිමින් ජීවත් වන අතර ඔවුන්ගේ සාම්ප්‍රදායිකත්වයට ඔවුන්ගේ සංස්කෘතීන්ට මූලිකත්වය ලබාදෙයි. එයින් පිට සංස්කෘතීන් වෙත ගමන් කිරීමට තමන්ගේ පාරම්පරික ඇවතුම් පැවතුම් වෙනස් කිරීමට ඔවුන් බියක් දක්වයි. එනම් වතුකරයේ මහා සංස්කෘතියට අනුගත වීමට, තරගකාරී සමාජය තුළ සංවර්ධනය වී ඇති සමාජය තුළට බැස ජීවත් වීමට ඔවුන් මැලිකමක් මෙන්ම ඒ සඳහා අනුගත වීමට අකමැත්තක් දක්වයි. මේ හේතුවෙන් ඔවුන්ට ඔවුන්ගෙන් පසු පරම්පරාවට ද ඔවුන්ගේ සංස්කෘතියෙන් එහා යෑමට උගන්වන්නේ නැත. මේ හේතුව නිසාවෙන් ඔවුන් ඔවුන් විසින්ම මහා සමාජය, සංස්කෘතිය තුළින් පසුපසට යෑමත් ඔවුන් විසින්ම ඔවුන් නොසලකා හරින කොන් කරන, ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවක් ලෙස ලේබල් කර ගැනීමත් සිදුවන බව ඔවුන්ගේ අදහස් හා සිතුම් පැතුම් හරහා, රැකියාවන් සඳහා අධ්‍යාපනය සඳහා ඇති ආකල්ප හමුවේ මෙන්ම ඔවුන් එදිනෙදා ගෙවන ජීවන රටාවන් හමුවේ හඳුනාගත හැකි ප්‍රබල කරුණකි. නමුත් ඔවුන්ට ඵලදායි යහපත් ජීවන රටාවක් ලබා ගැනීමට නම් තරගකාරී සමාජයට යොමු වීමත්, සංස්කෘතීන්ට අනුගත වීමට මෙන්ම සංවර්ධනය වන සමාජය තුළ දැනුම තොරතුරු ලබා ගැනීමට, ඉදිරි පරම්පරාව ධනාත්මක ලෙස සමාජානුයෝජනය කිරීම මෙන්ම බලමුලු ගැන්වීම හරහා පුරවැසිභාවය ලබා ගන්නා සේම ශ්‍රී ලංකාව තුළ සංවර්ධිත දමිළ ජන කොට්ඨාසයක් බවට පත්විය හැකිය.

මෙම ප්‍රජාවගේ සංස්කෘතික වර්ධනයට, ප්‍රජාව වර්ධනයට විවිධ සංවර්ධන වැඩසටහන් ඉදිරිපත් කර ද ඒවා සාර්ථක නොවන්නේ ඔවුන් තවමත් ශ්‍රී ලාංකීය සමාජය තුළ පවතින ජාතික හැඟීමට අනුගත නොවී ඇති බැවිනි. එනම් ඔවුන් බොහෝ විට ජනවාර්ගිකත්වයට එනම් ඉන්දියානු දමිළ යන ජනවාර්ගිකත්වයට ඇලුම් කරයි. මේ පිළිබඳව ආනන්ද (2014) ශ්‍රී ලංකාවේ බෞද්ධ සමාජ ව්‍යාපාර ප්‍රොටෙස්ටන්ත බුදුසමය හා ධනවාදී ක්ෂාරය උත්සහ කරන්නේ යම් ජාතියක් හෝ ආගමක් සංවර්ධනය කිරීමට ඔවුන් තුළ ජාතිකත්වය (National Building) යන හැඟීම ඇතිවිය යුතු බවයි. එසේ නොවන්නේ නම් සංවර්ධන වැඩසටහන් සහ ප්‍රතිපත්ති යනු නිෂ්ඵල සහ චාරිත්‍රයක් ලෙස ගොඩනැගෙන ක්‍රියාවලියක් බවට පත්වෙන බව පැහැදිලිය. ඒ අනුව සංස්කෘතික සහ දේශපාලනික වශයෙන් මෙම ප්‍රජාව තුළ ශ්‍රී ලාංකික යන අනන්‍යතාවය සහ ජාතික හැඟීම වර්ධනය කරගත යුතුය.

ඔවුන් විසින්ම මානසික තත්වය ගොඩනගා ගත යුතු අතර එයට අවශ්‍ය වපසරිය රාජ්‍ය ආයතනය, දේශපාලන පක්ෂ සහ රාජ්‍ය නොවන ආයතනයන්ගේද මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ.

එයට හේතුව වන්නේ ඔවුන්ගේ ශ්‍රමය අනෙකුත් සියලුම ක්ෂේත්‍රයන්ගේ අභිබවා රට තුළ විශාල ආදායමක් ලබා දෙන නිසා දමිළ ප්‍රජාව යනු ශ්‍රී ලාංකික බවු සංස්කෘතියේ නියෝජනය කරන තවත් ඒත් වටිනා ජනකොට්ඨාසයක් වීම හේතුවෙනි. එසේම දෛනිකව වැටුප් ලබන ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වන ප්‍රධාන පෙළේ පිරිසක් වීම හෙයින් ඔවුන්ගේ ද පෞද්ගලික ජීවන සංවර්ධනය කරා ළඟා කර ගැනීමට දරිද්‍රතාවයෙන් අවම වීමට මෙන්ම අවුරුදු 200ක දරිද්‍රතාවයෙන්, දුර්වලතාවයන් ඉවත් කර ගනිමින් බලමුළු ගැන්වූ බල මුළුගැන්වී සමාජයට අවතීර්ණ වන ශක්තිමත් ප්‍රජා කණ්ඩායමක් වීමට නම් ඉහත සඳහන් කරන ලද සියලුම කාරණාවන් සඳහා රජයේ රජයේ අවධානය හා මැදිහත්වීමත් මලෛයග දමිළ ප්‍රජාවගේ අවධානය හා ඒ වෙනුවෙන් වැඩ කටයුතු කිරීමත් සිදුකළ යුතුයි.

**නිගමනය**

ශ්‍රී ලංකාව බහුවිධ සංස්කෘතීන්ගෙන් හෙබි රාජ්‍යයක් වන අතර එන් සුවිශේෂී ජන කොට්ඨාසයක් ලෙස ඉන්දියාවෙන් මෙරටට වර්ෂ 1823-1834 දීපැමිණි දකුණු ඉන්දීය දමිළ ප්‍රජාව හඳුනාගත හැකිය ඔවුන් වතුකම්කරුවන් ලෙස මෙරටට ගෙන්වා ගත් අතර ඉන් පිරිසක් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්ට සංක්‍රමණය වී තේ කර්මාන්තය ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය කරගනිමින් ජීවත් වේ. 2023 වර්ෂය වන විට ඔවුන් මේ රටට පැමිණ අවුරුදු 200ක් සපිරෙයි.

සුළුතර ප්‍රජාවක් ලෙස මෙම මලෛයග දමිළ ප්‍රජාව දීර්ඝ කාලීන සමාජ ආර්ථික හා දේශපාලනික වශයෙන් බහිෂ්කරණයකට ලක්වීමට බලපාන ලද පුරවැසිභාවයේ අර්බුදය ආකාර ද්විත්වයකින් හඳුනා ගැනීමට හැකි විය. ඉන් පළමුව හේතු සාධකය ලෙස එම ප්‍රජාවගේ භූමිකාවන්වල පවතින ගැටලුකාරී තත්ත්වයන් හඳුනාගත හැකි විය. එනම් ඔවුන් ජාතික අනන්‍යතාවයට වඩා ජනවාර්ගික අනන්‍යතාවයට ප්‍රිය කිරීම මත ඔවුන් විසින්ම සමාජයේ අන්තිකරණයට ලක් වූ ප්‍රජාවක් ලෙස ලේබල් කරගෙන තිබීමත් ඔවුන් තුළ පවතින සෘණාත්මක සමාජානුයෝජනයත්, ඔවුන්ගේ උපසංස්කෘතිය මත පමණක් යැපෙමින් ජීවත් වීමත්ය. එමෙන්ම මීට අමතරව ප්‍රජාවක් ලෙස සංවර්ධනය කරා ළඟා වීමට අවශ්‍ය සවි බලගැන්වීමට උත්සාහ නොකිරීමත්, ඒ හරහා සමාජයේ දැනුම නොමැති වීමත්, ඒ තුළින් සමාජය තුළ බලයක් ලබා ගැනීමට නොහැකි වීමත්, බලය නොමැති වීම මත ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඔවුන්ට හඬක් නැගීමට නොහැකි වීමත් මත ඔවුන් දීර්ඝ කාලීනව ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස සමාජ, ආර්ථික, දේශපාලනික ගැටලුවලට මුහුණ දෙනු ලබයි.

එමෙන්ම දෙවන හේතු සාධකය ලෙස රජයේ භූමිකාවන් හඳුනාගත හැකිය. එහිදී රජයේ විවිධ සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මෙම ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා නිසි ක්‍රමෝපායන් හඳුනාගෙන නොමැති වීමත්, ගන්නා ලද බොහෝ ක්‍රියාමාර්ග එම ප්‍රජාවගේ දෛනික ජීවිතය හා සංස්කෘතිය සඳහා නොලගැලපෙන ඒවා බැවින් ඒවා අසාර්ථක වීමත් සිදුවිය හැකිය. එයට හේතුව වන්නේ මෙම දමිළ ප්‍රජාව සමාජය තුළ ආන්තීකරණයකට ලක්වී ඇති ප්‍රජාවක් බැවින් සමාජය තුළ ඔවුන් සැඟවුණු ප්‍රජාවක් (Hidden Community) ලෙස ජීවත්වීම හේතුවෙනි. එහිදී සමාජය තුළ හඬක් නොමැති වීම නිසා රජයේ අවධානයද මොවුන්ට අවම වීම මත මොවුන් දීර්ඝ කාලීන සමාජ, ආර්ථික, දේශපාලනික මෙන්ම ඔවුන්ගේ ජීවිතය සඳහා ඔවුන්ට උඩුකුරු චලානතාවයක් ලබා ගැනීමට හැකි සියලුම ප්‍රවේශ, එනම් අධ්‍යාපනය, රැකියා තත්ත්වයන්, යටිතල පහසුකම් සහ සෞඛ්‍ය යනාදී අහිමිවීම සිදුවේ. මෙලෙස රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේදී මෙම ප්‍රජාව සඳහා අවධානය ලබා නොදීම මෙන්ම ඔවුන්ගේ ජීවිතය නගා සිටුවීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොකිරීම මත ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලැබුණද මෙම ප්‍රජාව දීර්ඝකාලීන සමාජ, ආර්ථික, දේශපාලනික යන ප්‍රපංචයන් බහිෂ්කරණයට ලක්වී ඇත.

ඒ හරහා එම ප්‍රජාවට පමණක් නොව අනාගතයේදී ශ්‍රී ලංකාවක් වශයෙන් සංවර්ධනය වීමේදී සමාජයේ ගැටලු ඇති විය හැකිය. එනම් සමාජීය ගැටළු ලෙස හඳුනා ගැනීමේ දී සියදිවි නසා ගැනීම, මිනිස් කුට්ටනය, මන්දපෝෂණය, මාතෘ හා ළමා මරණ අනුපාතය ඉහළ යෑම, මත්ද්‍රව්‍ය ජාවාරම් ඇතිවීම, අධ්‍යාපන ක්ෂේත්‍රය යටිකුරු චලානතාවයක් ඇතිවීම ආදිය සිදුවිය හැකිය. ඒ අනුව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී නාගරික ග්‍රාමීය වතු යන සියලු අංශයන් කෙරෙහි අවධානය යොමු කිරීමත් ප්‍රජාවක් වශයෙන් එම ප්‍රතිපත්ති, සංවර්ධන වැඩසටහන් සඳහා උනන්දුවක් මෙන්ම ජාතික හැඟීම වර්ධනය කරමින් කටයුතු කිරීමටත් උත්සාහ කරන්නේ නම් ප්‍රජාවක් සමාජ, ආර්ථික හා දේශපාලනික යන ප්‍රපංචයන්ගේ සංවර්ධනයක් ලබා ගත හැකි බව නිගමනය කළ හැකිය.

**යෝජනා**

සුළුතර ප්‍රජාවක් ලෙස මලෙයගෙ දමිළ ප්‍රජාව දීර්ඝ කාලීනව සමාජ ආර්ථික හා දේශපාලනික වශයෙන් බහිෂ්කරණයට ලක් වීමට හේතුවන කාරණාවන් මූලික කරුණු ද්විත්වයක් යටතේ ඉහත දත්ත අනුව හඳුනාගත හැකි විය. ඒ අනුව රාජ්‍ය අංශයෙන් සහ දමිළ ජනතාවට මෙම තත්වයෙන් මිදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම් පැවරේ. ඒ සඳහා පහත ආකාරයේ යෝජනා ඉදිරිපත් කළ හැකිය.

**රාජ්‍ය අංශය සඳහා**

රජය විසින් පුරවැසිභාවය හරහා ඔවුන්ගේ අයිතීන් ගැන දැනුමත් කිරීම කළ යුතුය. රාජ්‍ය ප්‍රතිපත්ති ගොඩනැගීමේදී සහ අයවැය සැකසීමේ දී ඔවුන්ගේ සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම කළ යුතු තවත් ප්‍රධාන කාරනවක් ලෙස සඳහන් කළ හැකිය. එමෙන්ම දමිළ ජනතාවගේ කටයුතු පහසු කරවීම සඳහා දමිළ භාෂාව දන්නා නිලධාරීන් රාජකාරි සඳහා පත්කිරීම මෙන්ම සාමාන්‍ය ජනයා මෙන් ඔවුන්ටත් සම්පත් සමානව බෙදා වෙන් කිරීමට කටයුතු කිරීම කළ හැකිය. දමිළ ප්‍රජාවගේ උන්නතිය සඳහා ස්ථිර ක්‍රියාමාර්ග රජය තුළ තිබීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම තවත් වැදගත් ක්‍රියාමාර්ගයක් වේ. දෙමළ ප්‍රජාව බලගැන්වීම, ප්‍රතිපත්ති සම්පාදනය ආයතනයක අංශය සහ සාමාන්‍ය මහජනතාවගේ මැදිහත්වීමෙන් මූලික අයිතිවාසිකම්, පාලනයන්, යුක්තිය, ස්ත්‍රී පුරුෂ භාවය සමාන කිරීම සඳහා දැනුවත් භාවයෙන් යුත් වැඩසටහන් ඉදිරිපත් කිරීම මෙන්ම ප්‍රජාව මුහුනදෙන ගැටලුණ අසමානතාවයන් හා වෙනස්කොට සැලකීම් ආමන්ත්‍රණය කිරීම කළ යුතුය. ප්‍රතිපත්ති සැකසීමේදී දමිළ ජනයාගේ අදහස් සඳහා ද මූලිකත්වය ලබා දීම ඉහත සඳහන් කරන ලද සියලුම කාරණාවන් හා සමානවේ.

**රාජ්‍ය නොවන සංවිධාන සඳහා**

දමිළ ජනතාව බලමුලු ගැන්වීම සඳහා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය. එමෙන්ම දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්ති සැකසීමේදී  දී රජයට සහය ලබාදී, එම ප්‍රතිපත්ති මෙන්ම ඔවුන් ගන්නාවූ ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීමට සහයෝගය ලබා දීම සිදු කළ යුතුය.

**දමිළ ජනතාව සඳහා**

ශ්‍රී ලංකාවේ ජීවත් වන ශ්‍රී ලාංකිකයකු ලෙස ජානවාර්ගිකත්වයට වඩා ජාතියට ඇල්මක් දක්වන්නේ නම් ශ්‍රී ලංකාවේ රජය විසින් සපයන සංවර්ධනීය ක්‍රියාමාර්ග ඔස්සේ තම සංවර්ධනය ළඟා කර ගැනීමට හැකියාව පවතී. සමාජය මෙන්ම පුරවැසියෙකු ලෙස ලැබෙන වරප්‍රසාදයන් මෙන්ම අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් වීම ඔවුන් කළ යුතු ප්‍රධාන කර්තව්‍යයකි. නිවැරදි සමාජානුයෝජන ක්‍රියාවලියක් පවුල් තුළින් ගොඩනඟා ගැනීම සියලුම පරම්පරාවන් විසින් සිදු කිරීමට වග බලා ගත යුතුය. එමෙන්ම උප සංස්කෘතීන් තුළ පමණක් නොව මහා සංස්කෘතියටද අනුගත වෙමින් තරඟකාරී සමාජයට ප්‍රවේශ වීමට වැඩිහිටියන් මෙන්ම කුඩා වයසේ සිට දරුවන් ඒ සඳහා හුරු කිරීම සිදු කිරීම සහ කුඩා වයසේ මෙන්ම දරුවන් වැඩිහිටි වියට පැමිණි විට අධ්‍යාපනය නතර නොකර අධ්‍යාපනය තුළ නිරතවීමට

ඔවුන්ව බලගැන්වීම කළ යුතුය. එමෙන්ම උත්සාහ කළ යුතු ප්‍රධාන කාර්යයක් වන්නේ සමාජයේ අනිකුත් සියලු දෙනා සමඟම සන්නිවේදනය සිදු කිරීමට උත්සාහ කිරීමය.

**සමුද්දේශ**


ආනන්ද., එස්.ජී. (2014). ශ්‍රී ලංකාවේ බෞද්ධ සමාජ ව්‍යාපාර ප්‍රොටෙස්ටන්ත බුදුසමය හා ධනවාදී ක්ෂාරය

ඊරියගම., ටී. (2006). ශ්‍රී ලංකා ආර්ථිකයේ නූතන යුගය. ගොඩගේ සහෝදරයෝ

උයන්ගොඩ., ජේ. (2010). සමාජයේ අපි ඔක්කොම සමාන පුරවැස පුරවැසි භාවයේ දේශපාලන න්‍යාය සහ භාවිතය. සමාජ විද්‍යා සංගමය. කොළඹ.

ජයවර්ධන., කේ. (2004). ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම. කරුණාරත්න සහ පුත්‍රයෝ. හෝමාගම

ද සිල්වා., ආර්. (2005). ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය. සමාජ පොත් ප්‍රකාශන. ජා- ඇල

මනතුංග. අන්වර්. (2016). අනන්‍යතාවයක් සොයා යන වතුකරේ ද්‍රවිඩ ප්‍රජාව. යහ පාලන ලංකා

රත්නායක. එන්.වී.,(2016). වතු ප්‍රජායේ දරුවන්වයේ අධයාපන කුසලතා සහ ආර්ථිකමය බලපෑම.Journal of Social Statistics. Retrieved From: https://repository.kln.ac.lk/bitstream/handle/123456789/15455/STATICA%202016%20%203%2801%29.9-16.pdf?sequence=1&isAllowed=y

විජයකෝන්., එස්. (2016). වතු කම්කරුවන්ගේ ආර්ථිකය නගා සිටුවීම.

Bosumatari, D., & Goyari, P. (2013). Asian Journal of Multidisciplinary Studies Educational Status of Tea Plantation Women Workers in Assam: An Empirical Analysis. Retrieved From: https://core.ac.uk/download/pdf/229682615.pdf

Chandrabose A.S., Sivapragasam P.P.(2011). Red Color of Tea: Central Issues that Impact the tea plantation community in Sri Lanka.Kumara Book House. Colombo.

CS Global Partners. (2023, March 20). What Are The Different Types of Citizenship? - CS Global Partners. CS Global Partners Limited. https://csglobalpartners.com/resources/the-different-types-of-citizenship/

Dujan, P. (2023, August 8). Nationality and Citizenship: Are they different or the same? Visagov. https://www.visagov.com/en/blog/nationality-vs-citizenship#:~:text=Although%20they%20are%20similar%20in,you%20have%20rights%20and%20responsibilities

Institute of Social Development.(2017). 150 Years of Ceylon Tea and Community. Printsrilanka. Kandy.

Institute of Social Development.(2017). සැවොම කැටුව යාම : ශ්‍රී ලාංකීය කඳුකර දෙමළ ජනතාවගේ තිරසාර සංවර්ධනය උදෙසා. ප්‍රින්ට් ශ්‍රී ලංකා. මහනුවර.

Malaiyagam 200. Institute of Social Development. Cinesita Town Hall. Nuwaraeliya. Sri Lanka.

Saravanakumar, A. R., Jazeel, A. M., & Alshebeb, A. (2017). Challenges for Improving Quality in Education at Primary and Secondary Schools in India and Sri Lanka. Retrieved From: https://www.researchgate.net/publication/329773588_Challenges_for_Improving_Quality_i n_Education_at_Primary_and_Secondary_Schools_in_India_and_Sri_Lanka

Verit Research (2019). Hill Country Tamil of Sri Lanka: Analysis of Legal and Policy Issues Affecting Labor and Governance Structure.

Verit Research and Institute on Statelessness and Inclusion. (2019). Hill Country Tamils of Sri Lanka: Towards Meaningful Citizenship

Vijesandiran S. (2021). Study on Living Wage for the Sri Lankan Tea Estate Workers. Institute of Social Development.

Wikramasinghe N. (2017, June). Reorienting_the_Study_of_Citizenship_in_Sri_Lanka. Researchgate. Retrieved November 11, 2023, from https://www.researchgate.net/publication/321636361_Reorienting_the_Study_of_Citizenship_in_Sri_Lanka